සීමාසහිත ලංකා පොස්පේට් සමාගම

වාර්ෂික වාර්තාව *2021/22*



කෘෂිකර්ම අමාත්‍යාංශය

දැක්ම

“එප්පාවල පොස්පේට් නිධිය ප්‍රශස්ත ලෙස භාවිතා කරමින් පෝෂ්‍යදායී පොස්පරස් මඟින් අපගේ මාතෘභූමියේ සාරවත් පසක් නිර්මාණය කිරීම”



මෙහෙවර

“පරිසර හිතකාමී සහ නව ක්‍රමවේදයන් හරහා පොස්පරස් වලින් ස්වයංපෝෂිත වෙමින් ජාතික පොස්පේට් අවශ්‍යතාවය සැපිරීම"

පටුන

- හැඳින්වීම 01
- අධ්‍යක්ෂක මණ්ඩලය 02
- කළමනාකරණ කණ්ඩායම 03-04
- සභාපතිතුමාගේ ප්‍රකාශය 05-06
- අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 07-**09**
- මෙහෙයුම් සමාලෝචනය 2021/22 1**0**-1**3**
- මූල්‍ය ඉස්මතු කිරීම් 1**4**
- ආයතනික ව්‍යුහය 1**5**
- අනුමත කාර්ය මණ්ඩලය 1**6**
- විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව 1**7**
- විගණකවරුන්ගේ වාර්තාව 1**8**-2**3**
- මූල්‍ය ප්‍රකාශන
  - කාල පරිච්ඡේදය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 2**4**
  - 2022.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 2**5**
  - කාල පරිච්ඡේදය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය **26**
  - කාල පරිච්ඡේදය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය **27**
  - සංස්ථාපිත තොරතුරු, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **28-47**
- රැස්වීම් වාරය දැනුම්දීම **48**
- පෙරකලාසියේ ආකෘතිය **49**

හැඳින්වීම

සමාගමේ නම

සීමාසහිත ලංකා පොස්පේට් සමාගම (PB 308)

පිහිටි ස්ථානය සහ නීතිමය ස්වරූපය

සී/ස ලංකා පොස්පේට් ආයතනය 1992 ජූලි මස 10 වන දින සීමිත වගකීමක් සහිත සමාගමක් වශයෙන් 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපිත කරන ලද්දේ රාජ්‍ය කැනීම් හා ඛණිජ සංවර්ධන සංස්ථාවේ එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය ලෙස 1987 අංක 23 දරණ පොදු සංස්ථා හෝ රජයට අයිතිය පවරා ගන්නා ව්‍යාපාර පොදු සමාගම් වශයෙන් පරිවර්තනය කිරීමේ පනත යටතේය. කෙසේ නමුත් 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ මෙකී සමාගම නැවත ලියාපදිංචි කරනු ලැබ ඇත.

මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

බහු වාර්ෂික කෘෂි භෝග සඳහා පොහොර වශයෙන් යොදවන පාෂාණ පොස්පේට් කැනීම් සැකසුම සහ අලෙවි කිරීම සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය

කේ.එස්.අයි.සුහසේන මහතා	- සභාපති
ආර්.එම්.ඩබ්.බණ්ඩා මහතා	- අධ්‍යක්ෂ
ඒ.පී.මොරගොඩ මහතා	-අධ්‍යක්ෂ
ඩී.ආර්.ටී.රුවන්පුර මහතා	- අධ්‍යක්ෂ
ජේ.ඒ.ඩබ්.ජයසූරිය මහතා	- අධ්‍යක්ෂ
සුදත් අබේවර්ධන මහතා	- අධ්‍යක්ෂ

සමාගමේ ලේකම්
කල්රුප්කෝ මැනේජ්මන්ට් සර්විස් (පුද්ගලික) සමාගම, අංක 06, බලහේනමුල්ල පාර, කොළඹ 06

අවසාන මව් සමාගම
ශ්‍රී ලංකාවේ රජය වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම්ට මෙම සමාගමේ නිකුත් කළ කොටස් පිළිබඳව සම්පූර්ණ අයිතිය ඇත.

රේඛීය අමාත්‍යාංශය
කෘෂිකර්ම අමාත්‍යාංශය,
80/5, ගොවිජන මන්දිරය, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ලියාපදිංචි කාර්යාලය
අංක 73 1/1, නව කැළණි පාලම පාර,
කොළඹ 14.
දුරකථන අංකය - 0112459906/7
ෆැක්ස් අංකය - 0112459908

විගණකවරු
විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය,
නො : 306/72, පොල්දුව පාර,
බත්තරමුල්ල.

බදු උපදේශකවරු
අමරසේකර සහ සමාගම
වරලත් ගණකාධිකාරවරු,
නො.12 - රොටුන්ඩා උද්‍යානය,
කොළඹ 03.

බැංකුකරුවන්
ලංකා බැංකුව
මහජන බැංකුව
ජාතික ඉතිරිකිරීමේ බැංකුව

අධ්‍යක්ෂක මණ්ඩලය



කේ.එස්.අයි.සුභසේන මහතා
සභාපති



ආර්.එම්.ඩබ්.බණ්ඩා මහතා
අධ්‍යක්ෂ



ඒ.පී. මොරගොඩ මහතා
අධ්‍යක්ෂ



ඩී.ආර්.ටී. රුවන්පුර මහතා
අධ්‍යක්ෂ



එස්. අබේවර්ධන මහතා
අධ්‍යක්ෂ



ජේ.ඒ.ඩබ්. ජයසූරිය මහතා
අධ්‍යක්ෂ

කළමනාකරණ කණ්ඩායම



එච්. ආර්. යු. ඩී. බණ්ඩාර මහතා
සාමාන්‍යාධිකාරී



ආර්.එම්.පී. කරුණාරත්න මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී



ඩී. පී. යු. චාමර මහතා
මූල්‍ය කළමනාකරු



එස්.ඩී. රූපසිංහ මහතා
මෙහෙයුම් කළමනාකරු



එම්.එම්.ඩී. තිලකරත්න මහතා
මානව සම්පත් කළමනාකරු



කපිතාන් කේ.පී.ආර්.පී. කිරිඇල්ල මහතා
ආරක්ෂක කළමනාකරු



ඩී. ආර්.කේ. තිලකරත්න මහතා
ගණකාධිකාරී



ආර්. ඒ. ඒ. පී. රණසිංහ මහතා
අලෙවි විධායක



ඩී.බී. කීරියාවත්ත මහතා
අභ්‍යන්තර විගණක



එල්.එල්.ඩී.අයි. පැතුම් මහතා
නිෂ්පාදන ඉන්ජිනේරු



ඒ.එම්.සනත් බණ්ඩාර මහතා
යාන්ත්‍රික ඉංජිනේරු



එස්. ඒ. අබේසිරි මහතා
සැපයුම් නිළධාරී



එස්.එම්.ඒ.ආර්.කේ. මංචනායක මහතා
කාර්යමණ්ඩල නිළධාරී (පරිපාලන හා මානව සම්පත්)



ඩී.ආර්. ගුණරත්න මහතා
කම්හල් නිළධාරී



ඩී.එස්.එම්. දිසානායක මහතා
ගබඩා නිළධාරී

සභාපතිවරයාගේ පණිවිඩය

පොස්පේට් පාශාණය කෘෂිකර්මාන්තයට හා අනිකුත් කර්මාන්තවලට උපයෝගී කරගන්නා බොහෝ ප්‍රයෝජන ඇති වැදගත් වානිජ මූලයකි. ශාක වැඩීමට හා ප්‍රවර්ධනය පොස්පේට් ඉතා අත්‍යවශ්‍ය පෝෂකයකි. ගෝලීය පොස්පේට් පරිභෝජනය පොහොර නිෂ්පාදනයේ සිට විෂබීජනාශක ද්‍රව්‍ය නිෂ්පාදන (සෝදන ද්‍රව්‍ය) කර්මාන්තය, පිඟන් කර්මාන්තය හා වෙනත් කර්මාන්ත විශාල ගණනකට අදාළ වේ. ලෝක වෙළඳපොළ තුළ රොක් පොස්පේට් වඩාත් ස්වාභාවික හා තිරසාර බැවින් රසායනික පොස්පේට් පොහොර සඳහා කාබනික විකල්පයක් ලෙස පිළිගනු ලැබේ.

ලෝක පොස්පේට් සංචිත සීමාසහිත වන අතර නැවත ජනනය නොවේ. එමනිසා ඒවා උපරිම හා තිරසාර ක්‍රියාවලියක් තුළ ප්‍රයෝජනයට ගත යුතුයි. ලෝකයේ පොහොසත්ම සහ අසම සම පොස්පේට් නිධියක් ලෙස සළකන ශ්‍රී ලංකාවේ පොස්පේට් සංචිතය 33% - 40% ක පමණ P_2O_5 ඛණිජ අඩංගුවේ. 1971 දී එප්පාවල පොස්පේට් නිධිය සොයාගත් අතර, එය පොස්පේට් මෙ.ටො. මිලියන 60ක සංචිතයකි. ශ්‍රී ලංකාවේ දේශීය පොස්පේට් පොහොර අවශ්‍යතාවය සපුරාලීමට ලංකා පොස්පේට් සමාගම රොක් පොස්පේට් පොහොර නිපදවීම සිදුකරයි. වර්තමාන ධාරිතව අනුව ලංකා පොස්පේට් සමාගම දේශීය අවශ්‍යතාවය සඳහා එප්පාවල රොක් පොස්පේට් (ERP) මෙ.ටො 50,000ක් පමණ වාර්ෂිකව නිපදවන අතර, එය පුද්ගලික හා රාජ්‍ය පොහොර සමාගම් හරහා ගොවියන් වෙත බෙදාහරී.

වර්තමානයේ සමාගම විසින් එප්පාවල රොක්පොස්පේට් (ERP) සහ අධි - ශ්‍රේණියේ එප්පාවල රොක්පොස්පේට් (HERP) යනුවෙන් වර්ග දෙකක් නිපදවනු ලබන අතර මේවා ශ්‍රී ලංකාවේ බහු වාර්ෂික භෝග සඳහා පොහොර ලෙස භාවිතා කරනු ලැබේ. මීට අමතරව සමාගම විසින් පොල් පොහොර මිශ්‍රණාගාරයක් 2014 වර්ෂයේ සිට පවත්වාගෙන යයි.

රාජ්‍ය සංස්ථා හෝ රජය සතු ව්‍යාපාර පොදු සමාගම් වලට පරිවර්තනය කිරීමේ 1987 අංක 23 දරණ පනතේ කොන්දේසි යටතේ පොස්පේට් සමාගම 1992 ජූලි මස 10 වන දින සංස්ථාපිත කරන ලද්දේ රාජ්‍ය කැනීම් සහ ඛණිජ සංවර්ධන සංස්ථාවේ එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය පවරා ගැනීමටය. මෙම සමාගමෙහි සම්පූර්ණ අයිතිය ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාර ලේකම්තුමා සතුවෙයි. 1998 නොවැම්බර් මස බෝගල ග්‍රැෆයිට් ආයතනයේ වෙන්වීමත් සමඟ ලංකා පොස්පේට් සමාගම සම්පූර්ණයෙන්ම ස්වාධීන ආයතනයක් බවට පත්විය.

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව සෞභග්‍යයේ දැක්ම තුළින් ඉදිරි කෘෂිකාර්මික දියුණුව තුළින් සෞඛ්‍ය සම්පන්න හා ඵලදායී සමාජයක් බිහිකිරීම සඳහා ලංකා පොස්පේට් සමාගමට රටේ පොහොර නිෂ්පාදන කර්මාන්තය තුළින් භාරදූර කාර්යභාරයක් ඉටු කිරීමට තිබේ.

පොස්පේට් කර්මාන්තයට අදාල කාර්යයන් සඳහා ප්‍රමුඛත්වය ලබා දීම වෙනුවෙන් ආයතනය විසින් ඊට අදාල තාක්ෂණික වැඩි දියුණු කිරීම සහ නිෂ්පාදනය ඉහළ නංවා ගැනීමට අදාල කටයුතු මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතී .

2021/2022 න් අවසන් ගිණුම් වර්ෂයේදී දළ පිරිවැටුම රුපියල් මිලියන 741 ක් වූ අතර පසුගිය වර්ෂයේ රු.මි. 750 ක පිරිවැටුමට ආසන්න වටිනාකමකි. එසේම, සමාගම රු. මිලියන 119.97 ක මෙහෙයුම් ලාභයක් ලගාකර ගැනීම, 2019/2020 වර්ෂයෙන් පසු පිට පිට ලගාකරගත් විශිෂ්ඨ ජයග්‍රහනයකි. සමාගම රු.මිලියන 157.03 ක බදුපෙර ලාභයක් 2021/2022 වර්ෂයේ ලගාකරගැනීම පසුගිය වර්ෂයේ රු.මිලියන 150 හා සැසඳීමේදී 5% ක වැඩිවීමකි. සමාගම තේ, රබර්, පළතුරු වැනි විවිධ වර්ගවල පොහොර නිෂ්පාදනයට සැළසුම් කර තිබුනත් වෙළඳ පලේ යූරියා හා MOP වල හිඟය නිසා එය ළගාකර ගැනීමට නොහැකි විය.

එප්පාවල පොස්පේට් නිධියේ උපරිම ප්‍රයෝජනය ලබා ගැනීමට අදාළව පවත්නා හා නව ව්‍යාපාරික අවස්ථා දියුණු කිරීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටී. රටේ සමස්ථ කෙටි කාලීන බෝගවලට අවශ්‍ය වඩාත් ගැලපෙන පොස්පේට් වර්ග නිපදවීම ජාතික අවශ්‍යතාවයක් සහ වැදගත්කමක් ලෙස අප හඳුනාගෙන තිබේ. එමනිසා, සමාගමේ මීළඟ ක්ෂණික අවශ්‍යතාවය ලෙස දේශීය SSP නිෂ්පාදනය හඳුන්වාදීමේ මූලික පියවර දැනටමත් ආරම්භ කර ඇත.

වගකීමක් ඇති රජයේ ආයතනයක් ලෙස ලංකා පොස්පේට් සමාගම, මීට අමතරව රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව "බයෝ ග්‍රීන් පොස්පේට්", බයෝ ෆිල්ම් පොස්පේට් වැනි පරිසර හිතකාමී වැනි අගය එකතු කරන ලද පොහොර වර්ග නිපදවීමට ඉදිරියේදී පියවර ගනු ලැබේ.

.

කේ.එස්.අයි.සුභසේන
සභාපති
ලංකා පොස්පේට් සමාගම

අගය එකතු කරන ලද නිෂ්පාදන, මානව හිතවාදී පරිසර හා කාර්යමණ්ඩල පුහුණුවීම් වැඩ සටහන් වලට ප්‍රමුඛත්වය දෙමින් සේවකයන්ගේ කුසලතාවයන් හා හැකියාවන් සෑම අංගයකින්ම වැඩි දියුණු කිරීමට අපි එකතු වී වැඩ කරන්නෙමු.

අවසාන වශයෙන්, මේ සම්බන්ධයෙන් අප වෙත මඟ පෙන්වීම, ධෛර්‍යය, සහයෝගය හා දේශපාලන නායකත්වය ලබාදෙන කෘෂිකර්ම අමාත්‍යාංශය, කර්මාන්ත අමාත්‍යාංශයට, මහා භාණ්ඩාගාරයට සහ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට මාගේ ප්‍රණාමය පුදකරමි.

ලංකා පොස්පේට් සමාගමට එහි ඉදිරි කටයුතු සාර්ථක කර ගැනීමට හැකි වේවායි මම ප්‍රාර්ථනා කරමි.

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

සී/ස ලංකා පොස්පේට් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඔවුන්ගේ විගණනය කරන ලද ගිණුම් සහ 2022 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරයි.

1.0 සමාගමේ නම

සී/ස ලංකා පොස්පේට් සමාගම (ලි.ප.අ. PB 308)

2.0 පිහිටි ස්ථානය හා නීතිමය ස්වරූපය

රාජ්‍ය පතල් හා බණිජ සංවර්ධන සංස්ථාවෙහි එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය පවරා ගැනීම සඳහා 1987 අංක 23 දරණ රජයේ සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර පොදු සමාගම් බවට පත්කිරීමේ පනතට අනුව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සීමාසහිත ලංකා පොස්පේට් සමාගම සීමාසහිත වගකීම් සහිත සමාගමක් වශයෙන් 1992 ජූලි 10 වන දින සංස්ථාගත කරන ලදී. කෙසේ නමුත් මෙම ආයතනය 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරනු ලැබිය.

3.0 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ බහු වාර්ෂික භෝග සඳහා පොහොර වශයෙන් යොදා ගන්නා පොස්පේට් කැනීම් සිදුකිරීම, සකස් කිරීම හා අලෙවි කිරීම හා පොල් පොහොර මිශ්‍ර කිරීමයි.

4.0 මූල්‍ය ප්‍රකාශනය

මේ සමඟ අමුණා ඇති මූල්‍ය ප්‍රකාශනයෙන් වාර්තා කරන දිනට සමාගමේ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පෙන්නුම් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය තෘප්තිමත්ව සිටී.

මෙම මූල්‍ය ප්‍රකාශනය සැකසීමේදී සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති උපයෝගී කර ගනිමින් ඒවාට අනුරූපව සාධාරණව සහ ඒකාකාරීව නිගමන හා තක්සේරුකිරීම් සිදු කොට ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහසයි. මෙම වාර්තාවේ අනාවරණය කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සැලකිය යුතු වෙනසක් සිදුවී නොමැති බව ඔවුන්ගේ අදහසයී සමාගමේ අධ්‍යක්ෂකවරු විසින් වත්කම්වල සුරක්ෂිතභාවය රැක ගැනීමටත්, වංචා සහ අනෙකුත් අවිධිමත් කටයුතු වලක්වාගැනීමට සහ අනාවරණය කරගැනීමටත් පියවර ගෙන ඇත.

5.0 මූල්‍ය ප්‍රකාශන සහ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගණුදෙනු නිසි ලෙසට පෙන්නුම් කිරීමට සාධාරණව ඥාණාන්විතව සහ තක්සේරු කිරීම්වලට එළැඹීම සඳහා මනා ගිණුම්කරණ ප්‍රතිපත්තීන් භාවිතයට ගෙන ඇත. ගිණුම්කරණ කාල පරිච්ඡේදය තුළ ගිණුම්කරණ පිළිවෙත්වල කිසිදු වෙනසක් සිදු නොවීය.

6.0 දේපළ, පිරියත හා උපකරණ, ඒවායේ ගණනය කිරීම් සහ ක්ෂයවීම

සමාගම විසින් වර්ෂය තුළ දේපළ, පිරියත හා උපකරණ සඳහා දරා ඇති ප්‍රාග්ධන වියදම රු. 6,759,332.00 කි. දේපළ, පිරියත හා උපකරණවල ගණනය කිරීම හා ක්ෂය කිරීම්වල විස්තර මූල්‍ය ප්‍රකාශන තුළ සටහන් අංක 5.0 හා 26 හි පෙන්වා ඇත.

7.0 බදුකරණය

සමාලෝචිත වර්ෂය සඳහා බදු අයකළ හැකි ආදායම මත ව්‍යාපාරික ආදායම සඳහා 18% ක් සහ වෙනත් ආදායම් සඳහා 24% ක් සමාගම බදු ගෙවිය යුතුවේ.

8.0 ලාභාංශ

සමාලෝචනය කරන වසර සඳහා අවසාන ලාභාංශ රුපියල් මිලියන 25.0 ක් ප්‍රකාශයට පත් කරන ලදී.

9.0 ප්‍රකාශිත ප්‍රාග්ධනය

සමාගමේ මුළු ප්‍රකාශිත ප්‍රාග්ධනය වූ රුපියල් 72,510,000/- සාමාන්‍ය කොටස් 7,251,000 කින් සමන්විත වේ. සමලෝචනයට භාජනය කරන වසර ඇතුලතද ප්‍රකාශිත ප්‍රාග්ධනයේ වෙනසක් සිදුවී නොමැත.

10.0 කොටස් හිමිකාරීත්වය

පොදු සංස්ථා හෝ රජයට අයිතිව ඇති පවරා ගන්නා ලද ව්‍යාපාර පොදු සමාගම් වශයෙන් පරිවර්තනය කිරීමේ 1987 අංක 23 දරණ පනතේ 2(3) වගන්තිය යටතේ සමාගමේ එකම කොටස්කරු වනුයේ රජය වෙනුවෙන් (රාජකාරී මට්ටමින්) භාණ්ඩාගාර ලේකම්ය.

2022 මාර්තු 31 දිනට සමාගමේ කොටස් හිමිකාරීත්වය පිළිබඳ විස්තර පහත සඳහන් වන පරිදිවේ.

භාණ්ඩාගාර ලේකම්ට (රාජකාරී මට්ටමින්) සාමාන්‍ය කොටස් 7,251,000 කි.

සී/ස GSMB ටෙක්නිකල් සර්විස් පුද්ගලික සමාගමේ කොටස්කරුවෙක් වන සී/ස ලංකා පොස්පේට් සමාගම සාමාන්‍ය කොටස් 100,000 ක හිමිකාරීත්වය දරයි. (එකක් රු.10/- බැගින්)

මෙහි හිමිකාරීත්වය දැරීමේ ප්‍රතිශතය 16.66% කි.

11.0 කොටස් හිමිකාරීත්වයේ වෙනස්වීම

සමාගමේ කොටස් හිමිකාරීත්වයේ කිසිදු වෙනස්වීමක් 2022 මාර්තු 31 දින වන විට සිදුවී නැත.

12.0 සංස්ථාපිත සමාජ වගකීම

සමලෝචන වර්ෂය ඇතුලත සමාගම විසින් පුන්‍ය කටයුතු හා ආයතනික සමාජ වගකීම් සඳහා රුපියල් 100,000 ක් දරා ඇත.

13.0 සේවකයින්

වර්ෂය ඇතුලත සම්පූර්ණ සේවක මණ්ඩල පිරිවැය රුපියල් 351,355,607.00 කි.

වර්ෂය අවසානය වන විට සමාගම විසින් සේවයේ යොදවා ඇති සාමාන්‍ය සේවක සංඛ්‍යාව 336 ක් වේ.

14.0 අධ්‍යක්ෂකවරුන්

සමාලෝචිත වසර ඇතුලත පහත සඳහන් අය අධ්‍යක්ෂ තනතුරු දැරීය.

කේ.එස්.අයි.සුභසේන මහතා	-	සභාපති
ආර්.එම්.විජේසිංහ බණ්ඩා මහතා	-	අධ්‍යක්ෂ
ඒ.පී. මොරගොඩ මහතා	-	අධ්‍යක්ෂ
ඩී.ආර්.ටී. රුවන්පුර මහතා	-	අධ්‍යක්ෂ
ජේ.ඒ.ඩබ්. ජයසූරිය මහතා	-	අධ්‍යක්ෂ
සුදත් අබේවර්ධන මහතා	-	අධ්‍යක්ෂ

15.0 අධ්‍යක්ෂකවරුන් පත්වීම හා ඉල්ලා අස්වීම

ඉංජිනේරු අනිල් රණසිංහ මහතා - සභාපති (2021.08.02), එන්.එම්.එස්.කරුණාදාස මහතා - අධ්‍යක්ෂ (2022.03.03) ඉල්ලා අස්විය. කේ.එස්.අයි. සුභසේන මහතා - සභාපති (2021.08.02), ආර්.එම්.විජේසිංහ බණ්ඩා මහතා (2022.03.03) අලුතින් මේ වසර 2021/2022 තුළ පත් කරන ලදී.

16.0 අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය

සමාලෝචිත වර්ෂය ඇතුලත රුපියල් 2,861,370/- ක මුදලක් අධ්‍යක්ෂ මණ්ඩලයේ පාරිශ්‍රමික ගාස්තු හා වියදම වශයෙන් ගෙවා ඇත.

17.0 ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ උපරිම දැනීමේ සහ විශ්වාසය අනුව රජයට, සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම නිවැරදිව සහ නියමිත දිනට කර ඇත.

18.0 අනුකූලවීම

මෙම සමාගම ශ්‍රී ලංකාවේ හෝ අන්තැනකට අදාල නීතිරීති සහ රෙගුලාසි උල්ලංඝනය කිරීමේ කටයුතුවල නියැලී නොමැත.

19.0 අඛණ්ඩ බවේ පැවැත්ම

සමාගමේ මෙහෙයුම් කටයුතු ඉදිරි අනාගත කාලයක් දක්වා පවත්වා ගෙන යෑමට ප්‍රමාණවත් සම්පත් ව්‍යාපාරය සතුව පවතින බවට අධ්‍යක්ෂ මණ්ඩලය තෘප්තිමත්ව සිටින අතර ඒ අනුව සමාගමේ සෑම මූල්‍ය ප්‍රකාශනයක්ම අඛණ්ඩ පැවැත්ම පදනම මත පිලියෙල කර ඇත.

20.0 සංස්ථාපිත පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය හොඳ සංස්ථාමය පාලනයක් සහතික කර ඇත. පොදු ව්‍යාපාරයක් වශයෙන් කොටස්රුවන්ගේ අපේක්ෂා සහ අරමුණු මෙන්ම සමාගමේ අරමුණු වලට සමාන්තරව එහි කාර්යසාධනය පවත්වාගෙන යෑම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමයි.

21.0 අවදානම් කළමනාකරණය

සමාගම විසින් නීතිමය අවදානම අඩු කිරීම හෝ සම්පූර්ණයෙන් ඉවත් කිරීම සහතික කිරීම සඳහා ව්‍යවස්ථාපිත සහ නීතිමය අවශ්‍යතාවයන් ඉටුකර ඇත.

22.0 විගණකයින්

සමාගමේ වර්තමාන විගණකවරු ලෙස රජයේ විගණකාධිපති කටයුතු කරයි.

නව විගණකවරුන්ගේ පාරිශ්‍රමිකය සම්බන්ධව තීරණය කිරීමට අධ්‍යක්ෂක මණ්ඩලයට බලය පැවරිය යුතු බවට යෝජනා කරන යෝජනාවක්ද වාර්ෂික මහා සභා රැස්වීමේදී සලකා බැලීමට කටයුතු කොට ඇත.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය සඳහා 2022 මාර්තු 31 දිනට සමාගම විසින් සපයන ලද මුලු විගණන ගාස්තුව රුපියල් 400,000 ක් විය. බදු උපදේශන සේවා සැපයීම වෙනුවෙන් අමරසේකර සහ සමාගමට වර්ෂය සඳහා රුපියල් 220,500/- ක මුදලක් ගෙවන ලදී.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අදහස පරිදි මෙම සමාගම හෝ එහි අනු සමාගම් සමඟ හෝ විගණකයින්ගේ ස්වාධීනත්වයට බලපෑමක් වන ආකාරයේ කිසිදු සම්බන්ධතාවයක් නොවීය.

අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන්:



සභාපති



අධ්‍යක්ෂක

මෙහෙයුම් ක්‍රියාවලි සමාලෝචනය 2021/22

01. ආදායම

සමාගම 741.5 ක පිරිවැටුමක් වාර්තා කර ඇති අතර, එය 2020/2021 මූල්‍ය වර්ෂයේ රුපියල් මිලියන 750 ට සාපේක්ෂව සුළු පහත වැටීමකි.

වටිනාකම (රුපියල් මිලියන)



ප්‍රමාණය (මෙට්‍රික් ටොන්)



02. ලාභය

මෙහෙයුම් ලාභය

2021/2022 සඳහා සමාගමේ මෙහෙයුම් ලාභය රු. 119.97 ක් වේ. 2020/2021 වර්ෂයේ සිට අඛණ්ඩව වාර්තාකල එම මෙහෙයුම් ලාභය කැපී පෙනෙන ජයග්‍රහණයකි.



බදුවලට පෙර ලාභය (PBT)

2021/2022 මූල්‍ය වර්ෂය සඳහා PBT ලෙස සටහන් කර තිබුනේ රුපියල් මිලියන 157.03 කි. එය පසුගිය වසරේ රුපියල් මිලියන 150.00 ට සාපේක්ෂව 5% ඉහළ යාමකි.



03. ශුද්ධ වත්කම - (කොටස්කරුවන්ගේ අරමුදල්)

පසුගිය වසර අග වූ රු.මිලියන 950.89 සමග සසඳන විට, 2021/22 වසර අවසාන ශුද්ධ වත්කම් තත්ත්වය රුපියල් බිලියන 1.0 ක් දක්වා 12% ක ප්‍රතිශතයකින් ඉහළ ගොස් තිබේ.



04 මුළු වත්කම

වර්ෂය තුළ මුළු වත්කම් අගය ක්‍රමයෙන් බිලියන 1.183 දක්වා ඉහළ ගියේය. මෙයට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත්තේ වසර තුළ ස්ථාවර තැන්පතු මත ආයෝජනය මිලියන 119 කින් වැඩි වීමයි.



<u>ව්‍යාපෘති සහ යටිතල පහසුකම් සංවර්ධනය</u>

I. සමාගමේ තිරසාර සංවර්ධනය, ප්‍රජාවට සේවය කිරීම, රුපියල් බිලියන 10 කට වැඩි විදේශ විනිමය ඉතිරි කිරීම සඳහා එප්පාවල පොස්පේට් නිධිය උපයෝගී කර ගනිමින් සිංගල් සුපර් පොස්පේට් (SSP) නිෂ්පාදනය කිරීමට පියවර ගෙන තිබුණි. මෙයට අදාළ ස්වාධීන ශක්‍යතා අධ්‍යයන 2021 දී ආරම්භ කරන ලද නමුත් 2021 අප්‍රේල් මාසයේ සිට රට තුළ රසායනික පොහොර යෙදීම සම්බන්ධයෙන් රාජ්‍ය ප්‍රතිපත්තියේ වෙනස්වීම් හේතුවෙන් එය දිගටම කරගෙන යාමට නොහැකි විය. ඉහත අධ්‍යයනය 2021 සැප්තැම්බර් වන විට අවසන් කිරීමට බලාපොරොත්තු විය.

II. “එප්පාවල පොහොර” නමින් ජෛව පොස්පේට්, බයෝ ෆිල්ම් පොස්පේට්, නැනෝ පොස්පේට් වැනි විවිධ පොහොර වර්ග හඳුන්වා දීමේ හැකියාව සළකා බැලීම.

III. ක්‍රියාත්මක නොවන යන්ත්‍ර සූත්‍ර වැඩි දියුණු කර භාවිතා කිරීම සහ සමාගමේ නිත්‍ය මෙහෙයුම් සඳහා ඒවා භාවිතා කිරීම. (උදා : ක්‍රෂර් යන්ත්‍රය /ඇඹරුම් යන්ත්‍ර ආදිය)

IV. ජාතික අවශ්‍යතා සපුරාලීම සඳහා පවතින නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම සඳහා දැනට පවතින කර්මාන්තශාලා සහ යටිතල පහසුකම් සංවර්ධනය වෙනස් කිරීම.

V. මෙහෙයුම්වල ඵලදායීතාව, නිරවද්‍යතාවය සහ විනිවිදභාවය ඉහළ නැංවීම සඳහා ERP පද්ධතිය හඳුන්වා දීමට කටයුතු කර ඇත.

ප්‍රධාන කළමනාකරු
(සාමාන්‍යාධිකාරී)

මූල්‍ය ඉස්මතු කිරීම්

වර්ෂය සඳහා **(රු. '000)**

	2021/22	2020/21	2019/20	2018/19	2017/18
ආදායම	741,553	750,374	510,004	530,975	493,551
බදුවලට පෙර ලාභය / (අලාභය)	157,030	150,582	13,480	29,694	16,594
වර්ෂය සඳහා ශුද්ධ ලාභය / (අලාභය)	122,783	124,017	5,489	33,385	3,220
මුළු විස්තීර්ණ ආදායම (වියදම)	147,631	117,494	18,821	109,726	(4,475)

වර්ෂ අවසාන දිනට **(Rs. '000)**

	2021/22	2020/21	2019/20	2018/19	2017/18
කොටස්හිමියන්ගේ අරමුදල	1,068.519	950,888	831,378	771,646	669,834
කාරක ප්‍රාග්ධනය	798,299	685,183	528,312	477,360	419,904
මුළු වත්කම්	1,183,605	1,099,694	948,648	892,603	757,572
කාර්ය මණ්ඩල පිරිවැය	351,356	325,078	303,310	292,861	230,782
සේවක සංඛ්‍යාව **(ගණන)**	336	325	333	328	333

කොටසකට

	2021/22	2020/21	2019/20	2018/19	2017/18
ඉපැයීම් **(රුපියල්)**	16.93	17.10	0.76	4.68	0.44

අනුපාතයන්

	2021/22	2020/21	2019/20	2018/19	2017/18
දළ ලාභ අනුපාතය	46.8%	46%	37%	35.6%	36%
බදු පෙර ලාභ අනුපාතය	21.2%	20.1%	2.6%	5.6%	3.4%
ජංගම අනුපාතය **(වාර)**	13.97	10.70	14.56	11.67	11.09
කොටස්හිමියන්ගේ අරමුදලට ප්‍රතිලාභ **(%)**	11.49%	13.04%	0.66%	4.33%	0.48%

ආයතනික ව්‍යුහය


ලංකා ෆොස්ෆේට් සමාගමේ සංවිධාන ව්‍යුහය (24-04-2015)
සභාපති
HM 2-1
HM 1-3
HM 1-1
JM 1-1
MA 2-1
MA 1-1
PL 3
PL 2
PL 1

අනුමත කාර්ය මණ්ඩලය

කාණ්ඩය	වැටුප් කේතය	තනතුර	තනතුරු අංකය
ජ්‍යෙෂ්ඨ කළමනාකරු	HM - 2-1	සාමාන්‍යාධිකාරී	01
	HM - 1-3	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නිෂ්පාදන	01
		නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- නිෂ්පාදන නොවන	01
	HM - 1-1	මූල්‍ය කළමනාකරු	01
		නිෂ්පාදන කළමනාකරු	01
		මෙහෙයුම් කළමනාකරු	01
		පරිපාලන හා මානව සම්පත් කළමනාකරු	01
මධ්‍යම/මැදපෙළ කළමනාකරු	MM - 1-1	ගණකාධිකාරී	01
		යාන්ත්‍රික ඉන්ජිනේරු	01
		නිෂ්පාදන ඉන්ජිනේරු	01
		අභ්‍යන්තර විගණක	01
		සහකාර සැපයුම් කළමනාකරු	01
		සහකාර අලෙවි කළමනාකරු	01
		ආරක්ෂක කළමනාකරු	01
කනිෂ්ඨ කළමනාකරු	JM - 1 – 1	සැපයුම් නිළධාරී	01
		පරිපාලන නිළධාරී (පරිපාලන හා මානව සම්පත්)	01
		කම්හල් නිළධාරී	01
		ගබඩා නිළධාරී	01
කළමනාකාර සහායක	MA 2-1		28
	MA 1-1		30
ප්‍රාථමික මට්ටම	PL - 3		73
	PL - 2		80
	PL - 1		120
මුළු ගණන			**349**

විගණක සහ කළමනාකරණ කමිටුවේ වාර්තාව

සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම විගණන සහ කළමනාකරණ කමිටුව පත් කරන ලද අතර ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතුය. මහා භාණ්ඩාගාරය වෙනුවෙන් පත් කර ඇති අධ්‍යක්ෂක මෙම කමිටුවේ සභාපති ධූරය දරයි. රේඛීය අමාත්‍යාංශය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා හා තවත් විධායක නොවන අධ්‍යක්ෂවරයකු කමිටුවේ අනික් සාමාජිකයන් වන අතර විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිළධාරී වරයෙක් හා අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක නිරීක්ෂකයන් ලෙස කටයුතු කරයි.

රැස්වීම්

කොවිඩ් 19 වෛරසයෙන් බලපෑම මැද වුවත් කලින් ඉදිරිපත් වී තිබූ ගැටළු සාකච්ඡා කිරීමට, කළමනාකරණ හා විගණන කමිටුව 2021/2022 වර්ෂය තුළ තුන්වතාවක් රැස්විය. අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ලබා දීම සඳහා අභ්‍යන්තර විගණක විසින් භාරදෙන කාර්තුමය අභ්‍යන්තර විගණන වාර්තා හා පවත්නා පාලන විධි ඇගයීමට ලක් කරන ලදී.

නිගමනය

වාර්තාව සියුම් ලෙස පරීක්ෂා කිරීමෙන් අනතුරුව සමාගමේ ගිණුම් ප්‍රතිපත්ති හා මෙහෙයුම් පාලන විධි හා අවධානම් කළමනාකරණ ක්‍රියාවලිය සඳහා බලපාන වැදගත් ගැටළු නිවැරදි කිරීමට කමිටුව විසින් උපදෙස් දෙන ලදී. තවද සමහර වැදගත් කරුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ සැලකිල්ලට හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමු කරන ලදී.



සභාපති
විගණන සහ කළමනාකරණ කමිටුව
සී/ස ලංකා පොස්පේට් සමාගම

විගණකවරුන්ගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. IMU/A/LPL/FA/2020/06 මබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2021 දෙසැම්බර් 15 දින

සභාපති,
ලංකා පොස්පේට් සමාගම

ලංකා පොස්පේට් සමාගමේ ("සමාගම") 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ලංකා පොස්පේට් සමාගමේ 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තිර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 සමාගමේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම් සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකිය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය

ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරණ සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2007 අංක 7 දරණ සමාගම් පනතේ 163 (2) (ඇ) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධ වී යම් ගිවිසුමක්

සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 වෙනත් විගණන නිරීක්ෂණ

(අ) 2014 පෙබරවාරි 14 දින ආරම්භ කරන ලද පොල් පොහොර ව්‍යාපෘතිය සඳහා රු.21,226,633 ක ප්‍රාග්ධන වියදමක් දරා තිබුණ අතර ව්‍යාපෘතිය මඟින් වාර්ෂිකව රු. මිලියන 72 ක පොල් පොහොර ආදායමක්, රු.මිලියන 10 ක ශුද්ධ ලාභයක් හා වාර්ෂිකව ආදායම සියයට 10 කින් වර්ධනය කර ගැනීමට අපේක්ෂා කර තිබුණි. තවද පොල් පොහොර වෙළඳපලෙන් සියයට 10ක වෙළඳපල කොටසක් අත්පත් කර ගැනීම දිගුකාලීන අරමුණ වී තිබුණි. එසේ වුවද 2020 මැයි සිට නොවැම්බර් දක්වා ව්‍යාපෘතියට අමුද්‍රව්‍ය ලබා නොදීම මත පොල් පොහොර නිෂ්පාදනය සිදුවී නොතිබුණු අතර 2020 දෙසැම්බර් සිට 2021 මාර්තු කාලය තුල පොහොර නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය ලැබීම නිසා පොහොර නිෂ්පාදනය හා අලෙවියද ඉහළ ගොස් තිබුණි.

(ආ) 2011 වර්ෂයේදී චීනයේ පුද්ගලික ආයතනයකින් මිලදී ගන්නා ලද 6 Roller (TGM 160) මිල් යන්ත්‍රයට අවශ්‍ය අමතර කොටස් සැපයීමට නම් රු. 43,435,115ක වටිනාකමින් යුතු 6 Roller (TGM 160) නව මිල් ඇඹරුම් යන්ත්‍රයක් මිලදී ගත යුතුය යන කොන්දේසිය මත චීනයේ වෙනත් පුද්ගලික ආයතනයකින් 2014 වර්ෂයේදී මිලදී ගත් නව මිල් යන්ත්‍රයේ රු.11,513,434 ක් වූ මිල් පාදම කොටස, 2014 – 2016 අතර කාලය තුල මිල් යන්ත්‍ර සඳහා මිලදී ගත් රු.14,290,237 ක අමතර කොටස් හා මෙම මිල් යන්ත්‍රය ස්ථාපිත කිරීම සඳහා නොනිමි වැඩ ලෙස පෙන්වා ඇති රු.7,440,000 ක ඉදිකිරීමද 2021 ජූලි 30 දින දක්වා ප්‍රයෝජනයට ගැනීමකින් තොරව පැවතිණි.

(ඇ) ඉහල යන පොහොර ඉල්ලුමට ප්‍රමාණවත් පරිදි පොහොර සැපයීමට හා පොහොර ආනයන වියදම් අඩුකර ගැනීමේ අරමුණින් රු.34,654,178 කට පාවිච්චි කරන ලද ක්‍රෂර් යන්ත්‍රයක් මිලදී ගෙන තිබූ අතර එම යන්ත්‍රයේ කිසිම කොටසක යන්ත්‍රයේ වර්ගය, මාදිලිය, නිෂ්පාදන

සමාගම හෝ නිෂ්පාදිත රට පිළිබඳව තොරතුරු අඩංගු නොවන බව එවකට සිටි නිෂ්පාදන කළමණාකරු විසින් ලිඛිතව ඡායාරූපමය සාක්ෂි සහිතව, සාමාන්‍යාධිකාරීට දැනුම් දී තිබුණි. එම යන්ත්‍රය ස්ථාපිත දින සිට 2021 ජූලි 30 දින දක්වා කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි. තවද නව ක්‍රෂර් යන්ත්‍රයක් වෙනුවට පාවිච්චි කරන ලද යන්ත්‍රයක් මිලදී ගැනීමෙන් පොස්පේට් සමාගමට සිදුවී ඇති අලාභය හා අදාල යන්ත්‍රය භාවිතයට නොගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන් හඳුනා ගෙන ඔවුන් සම්බන්ධයෙන් සමාගමේ බලධාරීන් කටයුතු කර නොතිබුණි. එසේම මෙම යන්ත්‍රය 2014 වර්ෂයේ සිට අනාරක්ෂිතව තැබීම නිසා මේ වන විට යන්ත්‍රය විනාශ වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) රු.71,447,853ක් වූ ණයගැති ශේෂය තුළ වාරියපොල පොල් පොහොර ව්‍යාපෘතියේ වසර 3කට වැඩි කාලයක සිට හා එප්පාවල පොස්පේට් සමාගමේ වසර 6කට වැඩි කාලයක සිට පැවත එන පිළිවෙලින් රු.1,487,567ක හා රු.10,100,566ක ණයගැති ශේෂයන් පැවති අතර මෙම ණය ශේෂයන් අයකර ගැනීමට සමාගමට නොහැකි වී තිබුණි. මෙම ණයගැති ශේෂයට වර්ෂ කිහිපයක සිට පැවත එන රු.550,000 ක බැර ශේෂ හා 2005 වර්ෂයේ සිට පැවත එන මුදලට විකුණුම් රු.2,475,958 ක ශේෂයන් ඇතුළත් කර තිබුණි. මෙම බැරශේෂ හා ඉහත සඳහන් මුදලට විකුණුම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට ආයතනය අපොහොසත් විය.

(ඉ) 2019 ජනවාරි 07 දින සිට ධාවනයෙන් ඉවත් කර වෙන්දේසි කිරීමට නිර්දේශ කර තිබූ ඩබල් කැබ් රථය 2021 නොවැම්බර් 10 දින වන විටත් වෙන්දේසි කිරීමට හෝ ධාවනය සඳහා යොදාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාගමේ ප්‍රාථමික මට්ටමේ අනුමත කාර්ය මණ්ඩලයට අදාළව අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා කම්කරු තනතුරු එකක්ද, දෛනික පදනම මත සේවකයන් 29 ක්ද, වතු සහායක තනතුරේ 03 ක්ද බඳවාගෙන තිබුණි.

(උ) 2016, 2017, 2018 වර්ෂයන් වල සිට පැවත එන රු.3,808,331 ක යල් පිනූ තොග ඉවත් කිරීම සඳහා විගණන දිනය වන විටත් සමාගම විසින් කටයුතු කර නොතිබුණි.

(ඌ) වසර ගණනාවක සිට බැහැර කරන ලද අබලි යකඩ හා වෙනත් යන්ත්‍ර කොටස් යන්ත්‍රාගාර පරිශ්‍රයේ තැනින් තැන අනාරක්ෂිතව දමා තිබූ අතර ඒවා අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

සී/ස ලංකා පොස්පේට් සමාගම

2022 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

	සට.	2022 මාර්තු 31	2021 මාර්තු 31	විචලනය
ආදායම	17	741,553,282	750,374,365	(8,821,083)
විකුණුම් පිරිවැය	18	(394,462,952)	(404,998,186)	10,535,234
දළ ලාභය		**347,090,330**	**345,376,179**	**1,714,151**
කර්මාන්තශාලාන සහ පරිපාලන පොදු කාර්ය	19	(211,834,241)	(213,959,775)	2,125,534
විකුණුම් සහ බෙදා හැරීමේ පිරිවැය	20	(15,203,221)	(10,034,935)	(5,168,286)
මූල්‍ය පිරිවැය	21	(87,359)	(425,040)	337,681
මෙහෙයුමෙන් ලද ලාභය		**119,965,510**	**120,956,430**	**(990,920)**
වෙනත් ආදායම්	22	37,064,579	29,626,039	7,438,540
බදු ගෙවීමට පෙර ලාභය		**157,030,089**	**150,582,469**	**6,447,621**
ආදායම් බදු වියදම්	23	(34,247,300)	(26,565,277)	(7,682,023)
වසර සඳහා ලාභය		**122,782,789**	**124,017,192**	**(1,234,403)**
වෙනත් විස්තීරණ ආදායම්				
දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය	25	806,501	5,502,938	(4,696,437)
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් මත සැබෑ පාඩුව		24,041,442	(12,025,911)	36,067,353
වර්ෂය සඳහා අනෙකුත් සම්පූර්ණ විස්තීරණ ආදායම්		24,847,943	(6,522,973)	31,370,916
වර්ෂය සඳහා සම්පූර්ණ විස්තීරණ ආදායම		**147,630,732**	**117,494,219**	**30,136,513**
කොටසකට ඉපැයීම් (රු.)	26	**16.93**	**17.10**	**(0.17)**

16 සිට 23 දක්වා පිටුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 5 සිට 15 දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්යය අංගයක් වේ.

සී/ස ලංකා පොස්පේට් සමාගම

2022 මාර්තු 31 වන දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

(සියළුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)

	සට.	2022 මාර්තු 31	2021 මාර්තු 31	විචලනය
වත්කම්			(නැවත සඳහන් කර ඇත)	
ජංගම නොවන වත්කම්				
දේපල, පිරියත සහ උපකරණ	5	322,800,259	342,927,249	(20,126,990)
කොටස්වල ආයෝජනය (GSMB Tech. Services (Pvt) Ltd)	6	1,000,000	1,000,000	-
		323,800,259	**343,927,249**	**(20,126,990)**
වත්මන් වත්කම්				
තොග	7	135,586,812	107,190,952	28,395,860
වෙළඳ ලැබිය යුතු මුදල්	8	37,170,668	64,756,536	(27,585,868)
තැන්පතුවල පෙරගෙවුම් සහ අනෙකුත් ලැබිය යුතු මුදල්	9	58,541,717	60,823,750	(2,282,033)
ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත්	10	580,879,811	461,124,816	119,754,995
මුදල් සහ මුදල් සමාන දෑ	11	47,626,120	61,870,868	(14,244,748)
		859,805,128	**755,766,922**	**104,038,206**
මුළු වත්කම්		**1,183,605,387**	**1,099,694,171**	**83,911,216**
කොටස් සහ වගකීම්				
ප්‍රාග්ධනය සහ සංචිත				
ප්‍රකාශිත ප්‍රාග්ධනය	12	72,510,000	72,510,000	-
ප්‍රත්‍යාගණනය		134,762,275	133,955,774	806,501
රඳවාගත් ඉපැයුම්		861,246,731	744,422,502	116,824,229
මුළු හිමිකම්		**1,068,519,006**	**950,888,275**	**117,630,730**
ජංගම නොවන වගකීම්				
බැඳීම්	13	31,310,870	56,318,245	(25,007,375)
විලම්බිත බදු	14	22,269,086	21,903,935	365,150
		53,579,956	**78,222,180**	**(24,642,225)**
ජංගම වගකීම්				
වෙළඳ ගෙවිය යුතුදෑ		1,684,376	9,747,690	(8,063,314)
ගෙවිය යුතු ආදායම් බදු	15	25,765,717	17,673,641	8,092,076
අනෙකුත් ගෙවිය යුතු සහ උපචිත වියදම්	16	34,056,333	43,162,385	(9,106,052)
		61,506,426	**70,583,716**	**(9,077,290)**
මුළු හිමිකම් සහ වගකීම්		**1,183,605,387**	**1,099,694,171**	**83,911,216**

සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවලට අනුකූල වන බව මම සහතික කරමි.

මූල්‍ය කළමනාකරු **ප්‍රධාන කළමනාකරු**

16 සිට 23 දක්වා පිටුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 5 සිට 15 දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ.
මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.

මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී

සභාපති
කොළඹ, 2022 ජූලි 19

අධ්‍යක්ෂක
කොළඹ, 2022 ජූලි 19

සී/ස ලංකා පොස්පේට් සමාගම

2022 මාර්තු 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

(සියළුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ප්‍රත්‍යාගණන සංචිත	රඳවාගත් ඉපැයුම්	එකතුව
				(නැවත සකස් කරන ලද)
2019 අප්‍රේල් 01 දිනට ශේෂය (පෙර වාර්තා කර ඇත)	**72,510,000**	**128,452,836**	**630,415,254**	**831,378,089**
ගැලපීම - හිමිකම් නොගත් වෙළඳ ණයහිමියන් - (සටහන 24)	-		7,015,967	7,015,967
2020 අප්‍රේල් 01 දිනට ශේෂය (නැවත ප්‍රකාශ කර ඇත)	**72,510,000**	**128,452,836**	**637,431,221**	**838,394,056**
කාල පරිච්ඡේදය සඳහා ලාභය	-	-	124,017,192	124,017,192
PPE නැවත ඇගයීම මත කල් දැමූ බදු වගකීම්		5,502,938	-	5,502,938
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් පිළිබඳ සැබෑ පාඩුව	-	-	(12,025,911)	(12,025,911)
කාල සීමාව තුළ ගෙවන ලද ලාභාංශ	-	-	(5,000,000)	(5,000,000)
2021 මාර්තු 31 දිනට ශේෂය	**72,510,000**	**133,955,774**	**744,422,502**	**950,888,275**
2021 අප්‍රේල් 01 දිනට ශේෂය	**72,510,000**	**133,955,774**	**744,422,502**	**950,888,275**
කාල පරිච්ඡේදය සඳහා ලාභය	-	-	122,782,789	122,782,789
දේපළ, පිරියත සහ උපකරණ මත විලම්බිත බදු - (සටහන 25)		806,501	-	806,501
විශ්‍රාම ප්‍රතිලාභ මත ආයු ගණන අලාභ	-	-	24,041,442	24,041,442
කාල සීමාව තුළ ගෙවූ ලාභාංශ	-	-	(30,000,000)	(30,000,000)
2022 මාර්තු 31 දිනට ශේෂය	**72,510,000**	**134,762,275**	**861,246,731**	**1,068,519,007**

16 සිට 23 දක්වා පිටුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 5 සිට 15 දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්‍යය අංගයක් වේ.

සී/ස ලංකා පොස්පේට් සමාගම

2022 මාර්තු 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)

	2022 මාර්තු 31	2021 මාර්තු 31
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය		
බදු වලට පෙර ලාභය	157,030,089	150,582,469
ගැලපීම්:		
ක්ෂය වීම	42,132,556	41,316,039
බැඳීම්	552,177	8,172,671
හඳුනාගත් සැබෑ පාඩුව / (ලාභ)	-	-
යල් පැන ගිය අයිතම සඳහා ප්‍රතිපාදන	3,421,598	-
හානිකරණ සඳහා ප්‍රතිපාදන	3,450,000	-
පොලී ආදායම	(30,638,969)	(26,947,471)
ලාභාංශ ආදායම	(500,000)	-
ESC කපා හැරීම	-	2,278,392
ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය	**175,447,451**	**175,402,100**
කාරක ප්‍රාග්ධන වෙනස්කම්		
තොග	(34,363,360)	(2,921,003)
වෙළඳ ලැබිය යුතු මුදල්	27,585,868	(29,587,368)
තැන්පතුවල පෙරගෙවුම් සහ අනෙකුත් ලැබිය යුතු මුදල්	2,282,033	(4,919,934)
වෙළඳ ගෙවිය යුතු දෑ	(8,063,314)	6,274,051
වෙනත් ගෙවිය යුතු උපචිත වියදම්	(9,106,052)	14,677,743
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ (යෙදවූ) මුදල් ප්‍රවාහය	**153,782,626**	**158,925,588**
ගෙවූ ආදායම් බදු	(24,983,572)	(8,603,704)
පාරිතෝෂික ගෙවීම්	(1,518,110)	(7,817,778)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ (යෙදවූ) ශුද්ධ මුදල් ප්‍රවාහය	**127,280,944**	**142,504,107**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය		
දේපල සහ උපකරණ මිලදී ගැනීම	(6,686,075)	(3,881,307)
ප්‍රාග්ධන නොනිමි	(16,223,589)	-
ලැබූ පොළී	30,638,969	26,947,471
කෙටිකාලීන තැන්පතුවල ආයෝජන	(119,754,996)	(124,676,966)
ලැබූ ලාභාංශ	500,000	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ (යෙදවූ) ශුද්ධ මුදල් ප්‍රවාහය	**(111,525,690)**	**(101,610,803)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය		
ගෙවූ ලාභාංශ	(30,000,000)	(5,000,000)
මූල්‍ය ක්‍රියාකාරකම්වලට යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(30,000,000)**	**(5,000,000)**
මුදල් සහ මුදල් සමාන දෑ වල වර්ෂය තුළ සිදුවූ ශුද්ධ වෙනස්කම්	**(14,244,747)**	**35,893,304**
වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන මුදල්	61,870,868	25,977,564
වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ මුදල් (සටහන 11)	**47,626,121**	**61,870,868**
වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ වලින් නිරූපනය කරනු ලබන්නේ,	***Mar 31, 2022***	***Mar 31, 2021***
අතේ මුදල් සහ බැංකුව	47,626,121	61,870,868
	47,626,121	**61,870,868**

16 සිට 23 දක්වා පිටුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 5 සිට 15 දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ.

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)

5 දේපළ, පිරියත හා උපකරණ

පිරිවැය/ප්‍රත්‍යාගණනය	2021 අප්‍රේල් 01 දිනට ශේෂය	එකතුකිරීම්	ඉවත්කිරීම්	2022 මාර්තු 31 දිනට ශේෂය
ගොඩනැගිලි	149,755,588.94	492,532.28		150,248,121
අභ්‍යන්තර මාර්ග	65,139,730.22			65,139,730
යන්ත්‍ර සහ පිරියත	88,955,050.00	1,056,948		90,011,998
මෝටර් වාහන	96,515,000.00	-		96,515,000
කාර්යාල උපකරණ	7,235,569.17	187,023		7,422,593
විදුලි උපකරණ	571,726.17	2,218,326		2,790,052
ලීබඩු සහ සවිකිරීම්	7,952,764.16	459,094		8,411,858
පරිගණක දෘඩාංග සහ මෘදුකාංග	6,089,315.00	2,345,409		8,434,724
	422,214,744	**6,759,332**	**-**	**428,974,076**

ක්ෂය	2021 අප්‍රේල් 01 දිනට ශේෂය	වර්ෂය සඳහා අයකිරීම්	මාරුකිරීම්	2022 මාර්තු 31 දිනට ශේෂය
ගොඩනැගිලි	11,826,193	5,990,224		17,816,417
අභ්‍යන්තර මාර්ග	22,646,062	3,247,924		25,893,986
යන්ත්‍ර සහ පිරියත	17,784,331	8,904,952		26,689,283
මෝටර් වාහන	38,606,000	19,303,000		57,909,000
කාර්යාල උපකරණ	2,835,896	1,471,458		4,307,354
විදුලි උපකරණ	54,852	146,047.84		200,899.96
ලීබඩු සහ සවිකිරීම්	2,927,296	1,644,993		4,572,290
පරිගණක දෘඩාංග සහ මෘදුකාංග	1,633,557	1,423,957		3,057,514
	98,314,186	**42,132,556**	**-**	**140,446,742**

ශුද්ධ පොත් අගය	2021 අප්‍රේල් 01 දිනට ශේෂය	වර්ෂය සඳහා අයකිරීම්		2022 මාර්තු 31 දිනට ශේෂය
ගොඩනැගිලි	137,929,396	(5,497,691)	-	132,431,704
අභ්‍යන්තර මාර්ග	42,493,668	(3,247,924)	-	39,245,745
යන්ත්‍ර සහ පිරියත	71,170,719	(7,848,004)	-	63,322,715
මෝටර් වාහන	57,909,000	(19,303,000)	-	38,606,000
කාර්යාල උපකරණ	4,399,674	(1,284,435)	-	3,115,239
විදුලි උපකරණ	516,874	2,072,278	-	2,589,152
ලීබඩු සහ සවිකිරීම්	5,025,468	(1,185,899)	-	3,839,569
පරිගණක දෘඩාංග සහ මෘදුකාංග	4,455,759	921,452	-	5,377,210
	323,900,557	**(35,373,223)**	**-**	**288,527,334**

කාරක ප්‍රාග්ධනය	2021 අප්‍රේල් 01 දිනට ශේෂය	එකතුකිරීම්	ඉවත්කිරීම්	2022 මාර්තු 31 දිනට ශේෂය
නව මෝල ස්ථාපනය කිරීම	18,953,434	-	(11,513,434)	7,440,000
නව TGM 160 Mill	-	29,926,525		29,926,525
අඩවියේ බලශක්ති උත්පාදන පද්ධතිය වැඩිදියුණු කිරීම	-	356,400	-	356,400
නව වාහන ගරාජය	73,258	419,275	(492,532)	-
	19,026,692	**30,702,200**	**(12,005,966)**	**37,722,925**
එකතුව	**342,927,249**			**326,250,259**
හානිකරණය සඳහා ප්‍රතිපාදන	**-**	(3,450,000)	-	**(3,450,000)**
	342,927,249			**322,800,259**

	2021/22	2020/21
6 GSMM ටෙක්නිකල් සර්විසස් (පුද්ගලික) සමාගමේ ආයෝජන **එකක් රුපියල් 10 බැගින් වූ කොටස් 100,000**	**1,000,000**	**1,000,000**

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)

	2022 මාර්තු 31	2020/2021
7 තොග		
වෙළඳ තොග - එප්පාවල (අවසාන නිමි තොග)	18,916,761	8,939,023.42
- (අමුද්‍රව්‍ය තොග)	22,199,493	20,428,571.15
තොගය - වාරියපොළ	-	4,499,504
උපලබ්ධි නොවූ ලාභ සඳහා වෙන්කිරීම	-	(550,178)
වෙනත් ද්‍රව්‍ය තොග - වාරියපොළ	-	2,377,209
සාමාන්‍ය තොග	101,700,487	75,305,154
	142,816,741	**110,999,283**
යල්පිනු තොග සඳහා වෙන්කිරීම	(7,229,929)	(3,808,331)
	135,586,812	**107,190,952**
8 වෙළඳ ලැබිය යුතු ද		
ණයගැතියෝ ERP/HERP	46,328,225	71,447,853
මුදලට විකුණුම් එකතුකිරීමේ ගිණුම - එප්පාවල	-	-
ණයගැතියෝ - පොල් පොහොර ව්‍යාපෘතිය	1,410,447	3,876,687
(-) බොල් හා අඩමාණ ණය සඳහා වෙන්කිරීම	(10,568,004)	(10,568,004)
	37,170,668	**64,756,536**
9 තැන්පතු, කලින් ගෙවීම හා වෙනත් ලැබිය යුතු ද		
සේවක ණය සහ අත්තිකාරම්	44,232,680	37,270,275
තැන්පතු සහ ඉදිරියට ගෙවීම්	5,091,398	14,678,101
කෙටිකාලීන ආයෝජන වලින් ලැබිය යුතු (ස්ථාවර තැන්පතු) පොළී ආදායම	9,182,035	8,838,504
කෙටිකාලීන ආයෝජන වලින් ලැබිය යුතු (රෙපෝ) පොළී ආදායම	35,604	36,870
	58,541,717	**60,823,750**
10 ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත්		
ස්ථාවර තැන්පතු	580,879,811	461,124,815
	580,879,811	**461,124,815**
11 මුදල් සහ මුදල් සමාන ද		
රෙපෝ - ලංකා බැංකුව	24,000,000	53,000,000
බැංකුවේ ඇති මුදල්	23,496,120	8,720,868
අතැති මුදල්	126,000	136,000
මුද්දර සංචිතය	4,000	14,000
	47,626,120	**61,870,868**
11.1 බැංකුවේ ඇති මුදල්		
ලංකා බැංකුව - එප්පාවල (A/C No 004641100)	9,370,437	1,249,023
මහජන බැංකුව - එප්පාවල (170-100180000025)	4,574,627	1,615,954
මහජන බැංකුව - වාරියපොළ - (A/C No 144-100200000025)	334,689	1,830,144
ලංකා බැංකුව - ග්‍රෑන්පාස් - (A/C No 0009300713)	9,216,368	4,025,746
	23,496,120	**8,720,868**
12 ප්‍රකාශිත ප්‍රාග්ධනය		
නිකුත් කර සම්පූර්ණයෙන්ම ගෙවා ඇත		
සාමාන්‍ය කොටස් 7,251,000	**72,510,000**	**72,510,000**

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)

	2022 මාර්තු 31	2020/2021
13 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම		
2021 අප්‍රේල් 01 දිනට ශේෂය	**56,318,245**	**43,937,440**
චත්මන් සේවා පිරිවැය	1,867,198	3,778,927
අතීත සේවා පිරිවැය	(5,268,562)	-
වර්ෂය සඳහා පොළී වියදම	3,953,541	4,393,744
වර්ෂය තුළ ගෙවීම්	(1,518,110)	(7,817,778)
විශ්‍රාම බැඳියාව මත ආයුගණන අලාභය	(24,041,442)	12,025,911
2022 මාර්තු 31 දිනට ශේෂය	**31,310,870**	**56,318,245**
14 විලම්භිත බදු		
වර්ෂය ආරම්භක ශේෂය	21,903,935	34,358,741
ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගත්නා ලද	1,171,652	(6,951,868)
වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනාගත්නා ලද	(806,501)	(5,502,938)
වර්ෂය අවසාන ශේෂය	22,269,086	21,903,935
15 බදු අයකිරීම් සඳහා ප්‍රතිපාදන		
ඉ/ගෙ ශේෂය	17,673,641	-
(+) වර්ෂය සඳහා ප්‍රතිපාදන	33,075,648	33,517,145
(-) වර්ෂය සඳහා ගෙවීම්	(24,983,572)	(8,603,704)
	25,765,717	**24,913,441**
බැරකම්		
(-) ලැබිය යුතු ESC	-	(4,715,845)
(-) ලැබිය යුතු රැදවුම් බද්ද	-	(2,523,955)
ප/ගෙ ශේෂය	**25,765,717**	**17,673,641**
16 අනිකුත් ගෙවිය යුතු දෑ හා උපචිත වියදම්		***(Re-Stated)***
උපචිත වියදම්	23,624,532	36,428,896
අනිකුත් ගෙවිය යුතු දෑ	10,431,801	6,733,489
	34,056,333	**43,162,385**
17 ආදායම්		
ඊ.ආර්.පී. (කි.ග්‍රෑ. 50)	659,600,865	599,124,595
චාරියපොල (ERP) විකුණුම්	1,907,394	629,875
යූරියා විකුණුම්	384,000	-
TSP විකුණුම්	30,000	-
එච්.ඊ.ආර්.පී	67,305,219	117,691,931
ඊ.ආර්.පී. (කි.ග්‍රෑ. 25)	1,522,250	9,680
පොල් පොහොර විකුණුම් - පරණ	117,285	1,080,160
පොල් පොහොර YPM සමස්ථ විකුණුම්	-	1,080,800
පොල් පොහොර YPM සිල්ලර විකුණුම්	28,000	28,000
පොල් පොහොර APM සම්පූර්ණ විකුණුම්	6,506,890	26,275,880
එප්පාවල රබර් පොහොර අලෙවිය	1,808,800	-
හර්ප් සේල්ස් ගොවිජන සේවා සහ බෙදාහරින්නන්	-	31,250
පොල් පොහොර APM සිල්ලර වකුණුම්	68,600	571,400
එම්.ඕ.පී	3,000	-
ඊ.ආර්.පී. (1KG)	9,450	262,975
ඊ.ආර්.පී. විකුණුම් ගොවිජන සේවා සහ බෙදාහරින්නේ	1,370,159	3,328,644
ඊ.ආර්.පී. විකුණුම් (කි.ග්රැම් 10 බෑග්ස්)	595,350	259,175
ඊ.ආර්.පී. විකුණුම් (කි.ග්රැම් 05 බෑග්ස්)	296,020	-
	741,553,282	**750,374,365**

18. විකුණුම් පිරිවැය	**2021/22**	**2020/21**	විචලනය
ආරම්භක වෙළඳ තොගය (2021 අප්‍රේල් 01 දිනට)	**29,367,595**	**49,027,337**	**19,659,742**
වර්ෂය තුළ වියදම් මාරු කිරීම			
කාර්යාල මණ්ඩල වේතන - ක්‍රෂර්	27,593,680	24,161,809	(3,431,871)
බලය ක්‍රෂර් 10%	2,565,816	143,479	(2,422,337)
ක්‍රෂර් අමකර කොටස්	138,913	233,634	94,721
පුද්ගල ආරක්ෂණ උපකරණ	7,512	35,324	27,812
ආයුධ සහ මෙවලම්	861,030	2,208	(858,822)
ක්ෂය - නිෂ්පාදන	15,041,223	14,892,934	(148,289)
පුරස්කාරය	47,247,383	44,224,542	(3,022,841)
පරීක්ෂණාගාර වියදම්	-	115,572	115,572
පරීක්ෂණාගාර ගොඩනැගිලි නඩත්තුව	2,734	1,571	(1,163)
සේවක පාරිශ්‍රමික	85,736,948	77,390,385	(8,346,563)
පොලිෆොපේලීන් ඇසුරුම්	71,773,595	53,556,198	(18,217,397)
බඳින කොකු	582,984	476,226	(106,758)
පාලම් තරාදි ගොඩනැගීම	-	-	-
ලිහිසි තෙල්	3,169,878	1,712,171	(1,457,707)
5 රෝලරය - සඳහා බලය 75%	23,662,526	20,374,061	(3,288,465)
MILL MAINT.-3- ROLLER	194,910	-	(194,910)
කම්හල් අමතර කොටස් - 5 රෝලරය (අළුත්)	7,345,197	10,570,942	3,225,745
කම්හල් නඩත්තුව 5 රෝලරය	6,578,994	811,211	(5,767,783)
කම්හල් නඩත්තුව 160 TGM	5,627,315	4,352,501	(1,274,814)
ෆෝක්ලිෆ්ට් - ඉන්ධන	244,073	163,930	(80,143)
ෆෝක්ලිෆ්ට් නඩත්තුව	578,118	292,494	(285,624)
වීල්ලෝඩරය නඩත්තුව 30%	-	9,929	9,929
ෆෝක්ලිෆ්ට් - ඉන්ධන	133,076	198,432	65,355
ෆෝක්ලිෆ්ට් නඩත්තුව	136,154	274,647	138,493
ෆෝක්ලිෆ්ට් ඉන්ධන (Uni Carrier)	327,115	326,499	(617)
ෆෝක්ලිෆ්ට් නඩත්තුව (Uni Carrier)	403,584	204,180	(199,404)
පුද්ගල ආරක්ෂක උපකරණ	745,611	253,273	(492,339)
ආයුධ සහ මෙවලම්	678,708	505,457	(173,251)
අසුරන වැසුම් යන්ත්‍ර වියදම්	162,843	46,649	(116,194)
සේවක පාරිශ්‍රමික (ආකරය)	12,134,284	10,272,335	(1,861,949)
වීල්ලෝඩර් - ඉන්ධන	38,038	43,649	5,610
වීල්ලෝඩරය නඩත්තුව (නව)	970,210	1,224,886	254,677
වීල්ලෝඩරය නඩත්තුව	243,036	-	(243,036)
924 කේ වීල්ලෝඩරය ඉන්ධන	1,847,298	1,494,553	(352,745)
924 කේ වීල්ලෝඩරය නඩත්තුව	1,869,938	1,628,527	(241,411)
වීල්ලෝඩරය නඩත්තුව (නව)	730,997	632,420	(98,577)
කැනීම් උපකරණ නඩත්තුව	69,822	129,751	59,929
සම්පීඩන නඩත්තුව	103,608	188,945	85,338
තෙල් හා ලිහිසි තෙල්	181,242	107,443	(73,799)
යන්ත්‍ර සූත්‍ර කුළියට ගැනීම	6,590,621	8,713,018	2,122,397
පුද්ගල ආරක්ෂක උපකරණ	82,142	165,640	83,499
අභ්‍යන්තර මාරු කිරීම - ට්‍රැක්ටරය 49-7541	62,819	197,878	135,058
අභ්‍යන්තර මාරු කිරීම - 46 ශ්‍රී 5636	1,985	1,658	(328)
ට්‍රේලරය - 44 ශ්‍රී 6600	-	49,105	49,105
නව ට්‍රැක්ටර් ට්‍රේලරය 01	46,107	182,679	136,573
නව ට්‍රැක්ටර් ට්‍රේලරය 02	172	-	(172)
නව ට්‍රැක්ටර් ට්‍රේලරය 03	4,499	-	(4,499)
නව වතුර බවුසරය	3,187	4,236	1,049
ට්‍රිපරය - NCLR 2142	1,324,686	3,778	(1,320,909)
ට්‍රිපරය - NCLL 6146	519,767	764,074	244,307
WPLL ට්‍රක්	252,187	423,703	171,516
NCLS ට්‍රක්	122,365	89,452	(32,914)
අභ්‍යන්තර මාරු කිරීම - ට්‍රැක්ටරය 270-0809	97,952	175,574	77,622
අභ්‍යන්තර මාරු කිරීම - ට්‍රැක්ටරය 49-2011	92,329	118,416	26,086
අභ්‍යන්තර මාරු කිරීම - 44 ශ්‍රී 6603	2,286	2,363	76
අභ්‍යන්තර මාරු කිරීම - 44 ශ්‍රී 6606	2,286	2,363	76
අභ්‍යන්තර මාරු කිරීම - 44 ශ්‍රී 6607	2,286	2,363	76
කැනීම් බලපත්‍ර	1,591,033	11,443,525	9,852,492
සේවක පාරිශ්‍රමිකය	27,943,397	29,250,149	1,306,752
විදුලි ජනක යන්ත්‍රය - ඉන්ධන	815,642	334,868	(480,774)
විදුලිබලය 5.25%	-	860,876	860,876
විදුලි ජනක යන්ත්‍ර නඩත්තුව	12,590	41,465	28,876
ආයුධ සහ මෙවලම් නඩත්තුව	810,742	355,682	(455,060)
උපලබ්ධි නොවූ ලාභ	(550,178)	419,900	970,078
වැඩහල	99,807	76,876	(22,931)
ක්‍රෂරය ගොඩනැගිල්ල	40,939	1,280,587	1,239,648
කැනීම් කාර්යාලය	17,125	45,691	28,567
ජල සැපයුම් නඩත්තුව	184,601	177,939	(6,662)
කම්හල් ගොඩනැගිලි	405,205	13,454	(391,751)
බරමැනීම් තරාදි නඩත්තුව	63,230	67,370	4,140
වෛද්‍ය නවාඩු සායනය	3,984,122	3,559,265	(424,857)
වාර්ෂික ප්‍රසාද දීමනා	2,316,165	2,364,000	47,835
ලෙඩ නිවාඩු මුදල්	20,991,234	17,911,058	(3,080,177)
පාලම් තරාදි නඩත්තු	583,298	462,978	(120,320)
කාර්යාල මණ්ඩල වේතන - විදුලි	7,065,612	5,313,287	(1,752,325)
මුළු වියදම්	**395,310,636**	**355,928,035**	**(39,382,601)**
	424,678,230	**404,955,372**	**(19,722,858)**
අවසාන වෙළඳ තොගය 2022 මාර්තු 31 දිනට	(41,116,254)	(29,367,595)	11,748,660
විකුණුම් පිරිවැය (LPL)	**383,561,976**	**375,587,778**	**(7,974,199)**
විකුණුම් පිරිවැය (CEP)	**10,900,975**	**29,410,408**	**18,509,433**

19. කර්මාන්තශාලා සහ පරිපාලන කටයුතු	2021/22	2020/21	විචලනය
කාර්යාල මණ්ඩල වේතන	21,330,335	34,929,049	13,598,714
කාර්යාල මණ්ඩල වේතනය - ගිණුම් සහ මූල්‍ය	11,671,885	8,509,521	(3,162,365)
කාර්යාල මණ්ඩල වේතනය - විගණනය	2,172,087	1,250,320	(921,768)
කාර්යාල මණ්ඩල වේතනය - වත්ත	7,225,597	7,073,566	(152,032)
කාර්යාල මණ්ඩල වේතනය - IT	1,748,802	1,238,275	(510,527)
කාර්යාල මණ්ඩල වේතනය - ආරක්ෂණ	25,599,469	18,947,856	(6,651,612)
කාර්යාල මණ්ඩල වේතනය - සැපයුම්	4,660,503	3,911,390	(749,113)
කාර්යාල මණ්ඩල වේතනය - ප්‍රවාහනය	12,418,564	9,590,467	(2,828,097)
කාර්යාල මණ්ඩල වේතනය - ප්‍රධාන වෙළඳසැල්	18,726,756	14,896,095	(3,830,661)
සේවක සුභසාධක	10,938,381	14,461,879	3,523,498
විදුලිය 9.75%	2,280,725	7,317,444	5,036,719
වාහන කුලී	472,165	695,899	223,734
ප්‍රවාහන හා යැවීමේ දීමනා	3,749,977	2,938,472	(811,505)
මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය	1,349,474	1,297,866	(51,608)
ක්ෂයවීම් ප්‍රධාන කාර්යාලය	27,091,333	26,423,105	(668,228)
පොත් හා වාරික ප්‍රකාශන	63,227	114,566	51,338
උත්සව වියදම්	-	36,240	36,240
ආරක්ෂක අයිතම	100,597	749	(99,847)
විවිධ වියදම්	239,388	325,438	86,050
ශිෂ්‍ය ශිෂ්‍යත්ව දීමනා	534,000	430,000	(104,000)
තැපැල් හා විදුලි පණිවිඩ	51,601	42,276	(9,325)
සේවක පුහුණුව	795,599	962,950	167,351
ගිනි නිවීමේ උපකරණ	235,450	35,300	(200,150)
සාමාන්‍ය කොටස් කපා හැර ඇත	2,666,987	-	(2,666,987)
ප්‍රධාන ගබඩාව	128,809	86,745	(42,064)
ආරක්ෂක නවාතැන	-	2,276	2,276
ආරක්ෂක කුටිය 3 (මුරපොළ)	-	3,333	3,333
ආරක්ෂක හා ප්‍රවාහන කාර්යාලය	20,069	55,229	35,160
වාහන ගරාජය	-	8	8
බයිසිකල් මේඩ් 01	56,255	360,053	303,798
ආපනශාලා හා සුභසාධන ගොඩනැගිලි	42,073	67,760	25,687
සාමාන්‍යාධිකාරී නිළ නිවාස	59,560	3,947	(55,613)
සේවක නිළ නිවාස නගරය	3,613	67,629	64,016
ප්‍රධාන කළමනාකරුගේ නිළ නිවාසය	1,420	7,799	6,379
කම්කරු නිළ නිවාස නගරය	1,763	56,024	54,261
සභාපතිගේ නිළ නිවාසය	45,445	56,632	11,187
ආරක්ෂක නිළධාරීන්ගේ නිළ නිවාස	22,500	300	(22,200)
පූපුරන ද්‍රව්‍ය ගබඩාව	-	124	124
සේවා ස්ථානය	19,900	-	(19,900)
ප්‍රථමාධාර ගොඩනැගිල්ල	15,777	15,546	(231)
විදුලිජනක යන්ත්‍ර ගොඩනැගිලි	96,068	43,540	(52,528)
ප්‍රධාන කාර්යාලය	40,111	97,808	57,697
කාර්යාල නඩත්තුව	-	34,800	34,800
සේවක විවේක කාමරය - කැනීම්	1,706	71	(1,635)
සේවක විවේක කාමරය - කම්හල	30,304	70,898	40,594
රියදුරු විවේක කාමරය	-	28,050	28,050
සාමාන්‍යාධිකාරී / නි.සාමාන්‍යාධිකාරී කාර්ය.	20,550	-	(20,550)
වැසිකිලි	30,202	198,650	168,448
සභාපති /විධායක අධ්‍යක්ෂ නිළ නිවාසය	6,549	5,230	(1,319)
විදුලි මාර්ග නඩත්තුව	102,022	26,927	(75,094)
දුරකථන මාර්ග නඩත්තුව	274,736	31,951	(242,785)
අමුද්‍රව්‍ය ගබඩාව	330	-	(330)
වෛද්‍ය යෝජනා ක්‍රමය	2,656,082	2,372,843	(283,238)
කාර්යාල උපකරණ	-	139	139
කාර්යාල නඩත්තුව	74,965	58,330	(16,635)
විදුලි උපකරණ	1,261,613	1,284,189	22,576
පරිශ්‍රය/සේවා	843,239	1,064,886	221,647
පරිගණක අළුත්වැඩියා	141,413	325,059	183,646
ලීබඩු සහ උපකරණ නඩත්තුව	-	160	160
දුරකථන - 02549121	19,238	13,279	(5,959)
දුරකථන - 02549290	23,690	22,986	(704)
දුරකථන - 2249601	41,431	52,842	11,411
දුරකථන - 2249647	21,782	26,419	4,636
අනතුරු රක්ෂණය	21,823	32,381	10,559
මාර්ගස්ථ මුදල් රක්ෂණය	498,378	504,081	5,703
වැඩබිම් රක්ෂණය	342,508	399,326	56,818
චාර්ෂික ප්‍රසාද දීමනා	1,544,110	1,576,000	31,890
ලෙඩ නිවාඩු මුදල්	13,994,156	11,940,705	(2,053,451)
කාර්යාල මණ්ඩල වේතනය - ප්‍රධාන කාර්යාලය	8,299,088	6,395,244	(1,903,844)
විගණන ගාස්තු	311,400	224,362	(87,038)
අධ්‍යක්ෂක ගාස්තු	1,014,740	842,615	(172,125)
අධ්‍යක්ෂක වියදම්	372,625	42,759	(329,866)
ටෙන්ඩර් මණ්ඩල වියදම්	91,500	77,750	(13,750)
විදුලිබලය	605,231	691,341	86,110

ADSL/ලයින් වියදම්	326,512	234,468	(92,044)
පැමිණීම සහ මාසික වැටුප් පද්ධතිය	250,728	-	(250,728)
පොදු වියදම්	892,523	2,851,138	1,958,615
පුවත්පත් සහ වාරික ප්‍රකාශන	32,510	40,840	8,330
කාර්යාල උපකරණ නඩත්තු	-	62,330	62,330
තැපැල් හා මද්දර ගාස්තු	3,875	7,690	3,815
මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය	691,898	517,591	(174,307)
වෘත්තීය ගාස්තු	1,120,000	1,363,750	243,750
බදු කුළිය ප්‍රධාන කාර්යාලය	1,301,086	1,275,483	(25,603)
ලේකම් වියදම්	1,200	-	(1,200)
ලේකම් ගාස්තු	615,177	426,556	(188,622)
ඉඩම් බදු	609,626	406,418	(203,209)
SSP ව්‍යාපෘතිය	548,425	1,461,468	913,043
හානිකරණය	3,450,000	-	(3,450,000)
සේවක පුහුණුව	798,419	291,228	(507,191)
දුරකථන - 459907	96,661	64,575	(32,086)
දුරකථන - 459908	122,592	134,179	11,587
දුරකථන - 459906	41,184	61,088	19,904
දුරකථන - 459909	29,907	24,292	(5,615)
ප්‍රවාහණ හා යැපීමේ දීමනා	1,330,939	1,367,391	36,452
දුරකථන බිල් ප්‍රතිපූර්ණය	1,388,559	1,561,963	173,403
ජලය	60,693	39,223	(21,471)
දුරකථන - 472698	13,079	24,713	11,633
පරිගණක අළුත්වැඩියා	695,647	1,183,666	488,019
පාරිතෝෂික	552,177	8,172,671	7,620,494
ඩ්‍රම් ට්‍රක් වාහන අංක NCLJ9309	672,335	317,863	(354,472)
විගණන හා කාර්යාල කමිටු වියදම්	146,640	192,500	45,860
වාහන අංක NC GA 1627	122,303	103,211	(19,092)
වාහන අංක NC JR 9672	170,613	278,434	107,821
වාහන අංක NC JR 9680	367,996	274,984	(93,012)
වාහන අංක NC PA 7906	213,914	207,277	(6,637)
වාහන අංක 252-5963	60,593	48,685	(11,907)
වාහන අංක 154 - 3641	11,087	5,546	(5,541)
වාහන අංක NC MA - 8755	396,963	471,829	74,865
වාහන අංක NC NB 5469	164,412	156,517	(7,895)
වාහන අංක WP PC 6891	416,578	832,198	415,620
වාහන අංක ඩබල් කැබ් - WP PF 5672	775,064	681,200	(93,864)
වාහන අංක ඩබල් කැබ් - WP PF 5673	1,156,422	917,862	(238,560)
සේවා ස්ථාන ද්‍රව්‍ය	224,298	172,228	(52,070)
වාහන අංක WP KQ 4329	1,008,623	1,192,503	183,880
වාහන අංක HK - 4629	5,399	6,626	1,227
මෝටර් බයික් අංක NC BCB 8782	6,453	27,113	20,661
මෝටර් බයික් අංක NC BCB 8777	8,709	28,268	19,559
IP VPN ගාස්තු	912,156	1,140,195	228,039
ISO ක්‍රියාත්මක කිරීම	51,260	-	(51,260)
පර්යේෂණ සහ සංවර්ධනය	6,480	43,632	37,152
දැන්වීම්	640,845	590,635	(50,210)
	211,834,241	**213,959,775**	**2,125,534**

20. විකිණීමේ හා බෙදහාරීමේ වියදම්

	2021/22	2020/21	විචලනය
කාර්යාල මණ්ඩල වේතන - අලෙවිකරණය	10,151,846	5,812,471	(4,339,374)
හදිසි දුරකථන ඇමතුම් 071 4 223 222	15,847	29,377	13,530
විකුණුම් ප්‍රවර්ධනය	720	283,931	283,211
ව්‍යාපාර ප්‍රවර්ධනය	1,382,388	313,557	(1,068,830)
බණිජ බද්ද	3,652,420	3,595,598	(56,822)
	15,203,221	**10,034,935**	**(5,168,286)**

මූල්‍ය පිරිවැය

	2021/22	2020/21	විචලනය
බැංකු ගාස්තු	87,359	290,334	202,975
ණය පොළිය	-	64,951	64,951
අයිරා පොළිය	-	69,754	69,754
	87,359	**425,040**	**337,681**

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)

		2022 මාර්තු 31	2020/2021
22	**අනෙකුත් ආදායම්**		
	විවිධ ආදායම්	3,158,132	261,683
	ලාභාංශ ආදායම	500,000	-
	ස්ථාවර තැන්පතු පොළී	29,656,858	24,725,722
	රෙපෝ පොළී ආදායම	982,111	2,221,749
		2,767,479	2,416,885
		37,064,579	**29,626,039**
	මෙහෙයුම් වලින් ලද ලාභය පහත අයිතම අඩුකල පසු දක්වා ඇත.		
	කාර්ය මණ්ඩල පිරිවැය	351,355,607	325,078,182
	ක්ෂයවීම්	42,132,556	41,316,039
	විගණන ගාස්තු	311,400	224,362
	අධ්‍යක්ෂ ගාස්තු	1,014,740	842,615
	විශ්‍රාම පාරිතෝෂික ගෙවීම්	1,518,110	7,817,778
23	**ආදායම් බදු**		
	වර්ෂයේ ලාභ මත ආදායම් බද්ද	33,075,648	33,517,145
	විලම්භිත බදු වලින් මාරු කිරීම	1,171,652	(6,951,868)
		34,247,300	**26,565,277**
23.1	**ආදායම් බදු වියදම් සැසඳීම**		
	බදුවලට පෙර ලාභය	157,030,089	150,582,469
	වෙළඳ නොවන ආදායම්	(31,138,969)	(26,947,471)
	ඉඩදිය නොහැකි වියදම් එකතුව	46,134,733	51,767,102
	බදු සඳහා වගකිව යුතු පූවර්-වසර ගැලපීම	7,015,967	-
	ඉඩදිය හැකි වියදම් එකතුව	(19,603,621)	(25,125,703)
	ව්‍යාපාරයෙන් තක්සේරු කල හැකි ආදායම	**159,438,200**	**150,276,398**
	වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ආදායම සහ නිදහස් ආදායම	**31,138,969**	**26,947,471**
	නිදහස් ආදායම		-
	අයකරගත හැකි අලාභය **23.2**	-	-
	ආයෝජන වලින් තක්සේරු කළ හැකි ආදායම	**31,138,969**	**26,947,471**
	මුළු තක්සේරු කල හැකි ආදායම	**190,577,168**	177,223,868
	සුදුසුකම් ලත් ගෙවීම්	-	-
	බදු අය කල හැකි ආදායම	**190,577,168**	**177,223,868**
	ව්‍යාපාරයෙන් බදු අයකල හැකි ආදායම මත බද්ද 18%	28,698,876	27,049,752
	ආයෝජනවලින් බදු අය කල හැකි ආදායම මත බද්ද 24%	7,353,352	6,467,393
	පසුගිය වසරට අදාළව /(අධික) ප්‍රතිපාදන යටතේ 14%	70,000	-
	වත්මත් ආදායම් බදු වියදම්	(3,046,580)	-
	වත්මන් ආදායම් බදු වියදම්	**33,075,648**	**33,517,145**
23.2	**බදු අලාභය**		
	ඉදිරියට ගෙන ආ අලාභය	-	15,894,518
	අලාභය	-	(15,894,518)
		-	-
	වර්ෂය තුළ උපලබ්ධි කරගත් පාඩුව	-	-
	ඉදිරි වර්ෂය සඳහා ඉදිරියට ගෙන ගිය අලාභය	**-**	**-**

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)

24 හිමිකම් නොගත් වෙළඳ ණයහිමියන්

රුග 2020.03.31 දින දක්වා වෙළඳ ණය හිමියන් යටතේ පෙන්වූ රුපියල් 7,015,967.35 2020.03.31 දින වෙනත් ණය හිමියන්ගේ ගිණුමට මාරු කරන ලදිග වසර 02 ක කාලය තුළදී සැපයුම්කරුවන් විසින් හිමිකම් පෑමක් සිදු කර නොමැති බැවින්ල වටිනාකම් සහ මූල්‍ය ප්‍රතිඵල ගෙනයාමට අවශ්‍ය ප්‍රවේශයන් පසුකාලීනව සම්මත කිරීමට කටයුතු කරන ලදිග

විස්තරය	ලෙජරයට අනුව ශේෂය	උප ලේඛනයට අනුව ශේෂය	
2020 මාර්තු 31 දිනට ගැලපීම්			*වගකීමට වන බලපෑම*
වෙනත් ණය දෙන්නන්	12,036,288	5,020,321	(7,015,967)
ධාරන අගයන්හි සිදුකරන ලද ගැලපීම (2019-03-31 -			
අවතක්සේරු කිරීම නිවැරදි කිරීම			**(7,015,967)**
			ස්කන්ධයට වන බලපෑම
ඉදිරියට ගෙන ආ රඳවාගත් ඉපැයීම්	630,415,254	637,431,221	7,015,967
ලාභ හෝ අලාභ ප්‍රකාශයේ සිදු කරන ලද ගැලපීම - (2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා) - ලාභ අවතක්සේරු කිරීම නිවැරදි කිරීම			**7,015,967**

25 නැවත තක්සේරු කිරීමේ සංචිත මත කල් දැමූ බදු ගැලපීම

	2021/22	*2020/21*
නැවත තක්සේරු කිරීමේ අතිරික්තය (මෝටර් වාහන නොමැතිව)	55,931,086	55,931,086
(-) වසර අවසානයේ දී නැවත තක්සේරු කළ මූදල මත ක්ෂය වීම	(12,827,945)	(8,551,964)
නැවත ඇගයීමේ ලාභය	**43,103,141**	**47,379,122**
ඉදිරියට ගෙන ආ කල්දැමූ බදු වගකීම්	8,960,491	14,463,429
ඉදිරියට ගෙන යන කල්දැමූ බදු වගකීම්	8,153,990	8,960,491
වෙනත් විස්තීර්ණ ආදායම් හා ප්‍රත්‍යාගණන සංචිතයට අදාළ වර්ෂය සඳහා ගැලපීම්	**806,501**	**5,502,938**

26 කොටසකට ඉපැයීම්

කොටසක සාමාන්‍ය ඉපැයුම /(අලාභය) ගණනය කර ඇත්තේ සාමාන්‍ය කොටස්කරුවන්ට බෙදාහැරිය හැකි ලාභය (අලාභය), වර්ෂය තුල බරතැබූ සාමාන්‍ය කොටස්වල එකතුවෙවී බෙදීමෙන්ය.

සාමාන්‍ය කොටස්හිමියන්ට ආරෝපණය කළ හැකි ශුද්ධ ලාභය (රු.)	122,782,789	124,017,192
බරකල සාමාන්‍ය කොටස් සංඛ්‍යාව (අංක)	7,251,000	7,251,000
කොටසක ඉපැයුම (රු.)	**16.93**	**17.10**

27. මූල්‍ය අවදානම කළමනාකරණය

වෙළඳපොළ අවදානම් (මුදල් අවදානම පොළී අනුපාත අවදානම සහ මිල මට්ටම් අවදානම් ඇතුලත්ව) ණය අවදානම, ද්‍රවශීල අවදානම් ආදී විවිධාකාර වූ මූල්‍ය අවදානම් වලට සමාගම භාජනය වේ. සමාගමක සමස්ථ අවදානම් කළමනාකරන ක්‍රියාවලිය අවිනිශ්චිත මූල්‍ය අවදානම මත පදනම් වී ඇති අතර සමාගමෙහි මූල්‍ය ක්‍රියාකාරීත්වය මත ඇති විය හැකි අහිතකර ප්‍රතිඵල අවම කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ ප්‍රතිපත්තීන්ට අනුකූලව මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් අවදානම් කළමනාකරණය ක්‍රියාත්මක කරනු ලබයි.

සමාගමේ මූලික මූල්‍ය උපකරණ කෙටිකාලීන තැන්පතු, මුදල් වෙළඳපොළ ආයෝජන, සහ මුදල් වලින් සමන්විත වේ. මෙම මූල්‍ය උපකරණ වල ප්‍රධාන අරමුණ වන්නේ සමාගමේ මෙහෙයුම් කටයුතු සඳහා ද්‍රවශීලතාවය වැඩි කිරීම හා පවත්වාගෙන යාම සහ සමාගමේ මූල්‍ය සංචිත මත වූ ප්‍රතිලාභ උපරිම කිරීම වේ. වෙළඳ ලැබිය යුතු, වෙළඳ ගෙවිය යුතු ආදී වූ ව්‍යාපාර කටයුතු වලින් සෘජුව ඇති වූ මූල්‍ය උපකරණ ද සමාගම සතුව ඇත.

(a) මූල්‍ය අවදානම

මූල්‍ය වත්කම්වල තත්ත්වය (ගුණය) හෝ භානිකරණයක් නොමැතිව තක්සේරු කලහැකි වනුයේ බාහිර ණය අනුපාත (තිබේ නම්) වලට හෝ ප්‍රතිවිරුද්ධ පැහැර හැරීමේ අනුපාත පිළිබඳ අතීත තොරතුරු වලට අනුකූලවය. ණය අවදානම හටගනු ලබනුයේ මුදල් හා මුදල් සමාන දෑ සහ බැංකු හා මූල්‍ය ආයතනවල ඇති තැන්පතු මෙන්ම ගනුදෙනුකරුවන්ගෙන් ලැබීමට ඇති ණය හිඟ ලැබිය යුතු දෑ සහ ඒ හා බැඳුනු ගනුදෙනු ඇතුලත්වය.

(b) වෙළඳ ලැබිය යුතු දෑ

වෙළඳ ලැබිය යුතු දෑ තුල අන්තර්ගත වී ඇත්තේ දේශීය ගනුදෙනුකරුවන්ය. ඉදිරියට කරගෙන යන ණය අගය කිරීම (විනිශ්චය කිරීම්) ක්‍රියා ත්මක කරනුයේ මූල්‍ය ගිණුම් ලැබිය යුතු දෑ කොන්දේසී මතය. එක් ප්‍රතිවිරුද්ධ පාර්ශවයක් හෝ ප්‍රතිවිරුද්ධ පාර්ශව කණ්ඩායමක් පිළිබඳව සැළකිය යුතු ණය අවදානමක් සමාගම සතුව නැත. සමාගමක් ණය කොන්දේසි අනුමත කිරීමට ප්‍රථම පාරිභෝගිකයා ඇගයීමට ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග පිහිටුවාගෙන ඇත.

(c) ද්‍රවශීල අවධානම

මුදල් ප්‍රවාහ පුරෝකථනය කිරීම කරනු ලබන්නේ මූල්‍ය අංශය විසිනී මෙහෙයුම් අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් මුදල් පවතීද යන්න තහවුරු කර ගැනීමට පුරෝකථනය කල සමාගමක ද්‍රවශීලතා නියමයන්ගේ හැසිරීම මූල්‍ය අංශය අධීක්ෂණය කරයි. කාරක ප්‍රාග්ධන කළමනාකරණය සඳහා අවශ්‍ය ප්‍රමාණයට වඩා ඇති අතිරික්ත මුදල් ඉහත සඳහන් ශේෂය බැංකු තැන්පතුවල ආයෝජනය කර ඇත. වාර්තාකරන දිනයේදී සමාගම සතුව තැන්පතු රුපියල් 580,879,811 (2021.03.31 රු. 461,124,816) පැවතීය. එය ද්‍රවශීලතා අවධානම් කළමනාකරණය කිරීමෙහිලා පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කර ගැනීමට අපේක්ෂා කරන ලදී.

(d) පොළී අනුපාත අවදානම

සමාගම සතුව මුදල් හා රාජ්‍ය හා ණය ගෙවීමට හැකි බැංකුවල, මුදල් හා බැංකු ශේෂ ඇත. ප්‍රතිලාභ වක්‍ර හැසිරීම සහ පොළී අනුපාත චලනයන් ක්‍රියාකාරීව අධීක්ෂණය කිරීමෙන් සමාගමට පොළී අනුපාත අවධානම පාලනය කල හැක.

(e) ප්‍රාග්ධන අවදානම් කළමනාකරණය

ප්‍රාග්ධන කළමනාකරණයෙහිලා සමාගමේ අරමුණ වනුයේ කොටස් හිමියන්ට සහ අනිකුත් පාර්ශවයන්ට ප්‍රතිලාභ ලබාදීම සඳහා ප්‍රශස්ත ප්‍රාග්ධන ව්‍යුහයක් පවත්වාගැනීම තුළින් අඛණ්ඩ පැවැත්මේ හැකියාව ආරාක්ෂා කරගැනීම වේ.

28. ප්‍රාග්ධන බැඳීම් හා අවිනිශ්චිත වගකීම්

පහත සඳහන් දෑ හැර සමාගමට ප්‍රමාණාත්මක ප්‍රාග්ධන කැපවීම් සහ අවිනිශ්චිත වගකීම් නොමැත.

	රු.
- රඳවාගැනීමේ මුදල් - නව Jaw ක්‍රෂර 2 ක මත (කේෂර ඉංජිනියරින් (පුද්ගලික) සමාගම පිළියන්දල)	4,386,358.40
- නොගෙවූ ඉඩම් කුළී - වාරියපොළ ඉඩම් ව්‍යාපෘතිය සඳහා ගල්ලහැපිටිය ප්‍රේමරතන හිමි	300,000.00

28.1 මූල්‍ය වගකීම්

පහත සඳහන් කරුණු හැර වාර්තාකරණ දිනය අවසානයේ කිසිදු ප්‍රමාණාත්මක මූල්‍ය බැඳීමක් නොතිබුණි.

	රු.
- විදුලි බිල්පත් ගෙවීම - 2022 මාර්තු	2,115,198.00
- යන්ත්‍රෝපකරණ කුළියට ගැනීම - ලයිමැක් මල්ටි සොලුෂන්ස්	909,450.00
- WPP බෑග් සැපයීම මත රඳවාගත් මුදල් - සෙන්ට්‍රල් පොලිසැක්	1,596,000.00
- ගෙවිය යුතු පුරස්කාරය - මාර්තු 2022 GSMB	10,830,704.70
- බනිජ බදු - මාර්තු 2022	666,030.84
- (නොගෙවූ) වාහන අලුත්වැඩියා ගාස්තු - යුනයිටඩ් මෝටර්ස් - කොළඹ	261,388.42

28.2 නීතිමය බැඳීම්

නඩු අංක, LPL/COU/03-1 සහ LPL/COU/03-02 යටතේ තුන්වන පාර්ශවයක් විසින් රු. මිලියන 2.5 අලාභයක් ඉල්ලා නඩු පවරා ඇත.

29. වාර්තාකරණ කාලයට පසු සිදුවීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය දින සිට මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන කිසිදු තත්ත්වයක් උද්ගත වී නොමැත.

30 සම්බන්ධිත පාර්ශව ගණුදෙනු

30.1 ප්‍රධාන කළමනාකරණ නිළධාරීන් සමඟ සිදුවෙන ගණුදෙන

සමාගමේ කටයුතු සැලසුම් කිරීම අධ්‍යක්ෂණය හා පාලනය සඳහා බලය හා වගකීම ඇති පුද්ගලයින් සම්බන්ධිත පාර්ශවයන්ට අයත්වන ප්‍රධාන කළමනාකරණ නිළධාරීන් වේ. ප්‍රධාන කළමනාකරන නිළධාරීන්ට ව්‍යාපාරයේ අධ්‍යක්ෂකවරු ද ඇතුලත්වේ. අවුරුද්ද සඳහා අධ්‍යක්ෂකවරුන්ට ගෙවන ලද දීමනා පහත දැක්වේ.

	2021/2022	2020/2021
	Rs.	Rs.
කෙටිකාලින ප්‍රතිලාභ	2,861,370	2,339,568

30.2 අනෙකුත් සම්බන්ධිත පාර්ශව සමඟ සිදු වූ ගණුදෙන

මූල්‍ය වර්ෂය තුළ LKAS 24 යටතේ වෙනත් සම්බන්ධිත පාර්ශව ලෙස හඳුනාගත් ගණුදෙනු ක්‍රියාකාරකම් කිසිවක් නැත.

1. සංස්ථාපිත තොරතුරු

1.1 පිහිටි ස්ථානය සහ නීතිමය ස්වරූපය

රාජ්‍ය පතල් හා බණිජ සංවර්ධන සංස්ථාවේ එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය පවරා ගැනීම සඳහා 1987 අංක 23 දරණ රජයේ සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර පොදු සමාගම් බවට පත් කිරීමේ පනතට අනුව සීමාසහිත ලංකා පොස්පේට් සමාගම සීමාසහිත වගකීම් සහිත සමාගමක් වශයෙන් 1982 අංක 17 දරණ සමාගම් පනත අනුව 1992 ජූලි 10 වන දින සංස්ථා ගත කරන ලදී. කෙසේ නමුත් මෙම ආයතනය 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කර ඇති අතර, ශ්‍රී ලංකාව තුළ පවතී.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 14, නව කැළණි පාලම පාරේ, අංක 73 1'1 දරණ ස්ථානයෙහිද, පාෂාණමය පොස්පේට් (ඇපටයිට්) නිධිය එප්පාවලද පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ බහු වාර්ෂික භෝග සඳහා පොහොර වශයෙන් යොදා ගන්නා පොස්පේට් කැනීම සිදු කිරීම, සකස් කිරීම, හා පාෂාණ අලෙවි කිරීමයි. මීට අමතරව සමාගම විසින් පොහොර මිශ්‍ර කිරීමේ මෙහෙයුම් ක්‍රියාවලියක් 2014 වර්ෂයේදී වාරියපොළ කනත්තේවැවදී ආරම්භ කරන ලදී.

1.3 වාර්තාකරණ කාලපරිච්ඡේදය

2021.04.01 දින සිට 2022.03.31 දින දක්වා වූ කාල පරිච්ඡේදය මෙම මූල්‍ය වාර්තා වලින් ආවරණය කරනු ලබයි.

1.4 නිකුත් කිරීම සඳහා අනුමැතිය දුන් දිනය

2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට 2022 ජූලි අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය දෙන ලදී.

2. පිලියෙළ කිරීමේ පදනම

2.1 අනුකූලවීමේ ප්‍රකාශනය

සමාගමේ මූල්‍ය ප්‍රකාශන (මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය සමඟ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන්වල සාරාංශ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ගිණුම්කරණ ප්‍රමිතීන් (LKAS සහ SLFRS) වලට අනුව සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල වන ලෙස පිළියෙල කර ඇත.

2.2 මැනීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අඩංගු පහත සඳහන් ප්‍රමාණාත්මක අයිතමයන් හැර මූල්‍ය ප්‍රකාශන, ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන පිළියෙල කර ඇත.

- විකිණීම සඳහා තබා ඇති මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට මනිනු ලබයි.
- ආර්ථික ප්‍රතිලාභ බැඳියාවේ වගකීම වර්තමාන වටිනාකමට හඳුනා ගනී.
- සමාගමට ආදායම් උත්පාදනය කරන්න භාවිතා කරන ලද පොස්පේට් තැන්පතුවේ වටිනාකම විශ්වාසවන්ත ලෙස මිණුම් කිරීමට නොහැකි වූ බැවින් වත්කමක් වශයෙන් මූල්‍ය වාර්තාවල හඳුනාගෙන නොමැත.

-

2.3 ඉදිරිපත් කිරීමේ සහ ක්‍රියාකාරී ව්‍යවහාරික මුදල්

සමාගමේ ඉදිරිපත් කිරීමේ හා ක්‍රියාකාරී ව්‍යවහාර මුදල් ලෙස ශ්‍රී ලංකා රුපියල් වලින් මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. සියලුම මුල්‍ය ප්‍රකාශන ආසන්නම රුපියලට වැටයු ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත.

2.4 සංසන්දනාත්මක තොරතුරු

පෙර වර්ෂවල ගිණුම්කරණ ප්‍රතිපත්ති (LKAS 01) - මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමිතයට අනුව අඛණ්ඩව යොදාගෙන ඇත.

2.5 ප්‍රමාණාත්මකබව හා ඒකරාශි කිරීම

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම (LKAS 01) ප්‍රමිතියට අනුව සෑම ප්‍රමාණාත්මක සමාන අයිතම පන්තියක්ම මුල්‍ය ප්‍රකාශන තුළ වෙන වෙනම ඉදිරිපත් කර ඇත. ස්වභාවය හා ශ්‍රිතය සමාන නොවන අයිතමද ප්‍රමාණාත්මක නම් වෙන වෙනම ඉදිරිපත් කර ඇත.

මුල්‍ය වත්කම් හා මුල්‍ය වගකීම හිලව් කර ශුද්ධ වටිනාකම මුල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කිරීම පහත අවස්ථාවලදී පමණක් සිදුකල හැකියි. එහි හඳුනාගත් වටිනාකම හිලව් කිරීමට නීත්‍යානුකූලව බලාත්මක කල හැකි අයිතියක් තිබීම. එහි ශුද්ධ පදනමක් මත පියවීමේ අභිප්‍රායක් තිබීම. සමකාලීන ලෙස වත්කම් හා වගකීම් උපලබ්ධි කිරීම. ගිණුම්කරණ ප්‍රමිත හෝ අර්ථකථන මගින් අවශ්‍ය වන විට හෝ අවසර ලබාදෙන විට හෝ ගිණුම් ප්‍රතිපත්තීන් වල නිශ්චිතව අනාවරණය කළ විට හෝ හැර ආදායම් හා වියදම් ආදායම් ප්‍රකාශනය තුළ හිලව් කිරීම කළ නොහැක.

3. සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තුගත කිරීම් සහ උපකල්පනයන

මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනාගතයට අදාල යම් යම් තීරණාත්මක ගිණුම්කරණ උපකල්පනවල භාවිතය අවශ්‍යවේ. තවදුරටත්, සමාගමේ කළමනාකරණය විසින් වාර්තාකරණ කාලය අවසානයේදී අදායම්, වියදම්, වත්කම් සහ වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්වල අනාවරණය කිරීම්වල වටිනාකම් වාර්තා කිරීමට බලපාන විනිශ්චයන් ඇස්තමේන්තු ගත කිරීම් හා උපකල්පන ඇතිකර ගැනීමට අවශ්‍ය වේ.

කෙසේ වුවද උපකල්පන හා ඇස්තමේන්තු ගත කිරීම් පිළිබඳව අවිනිශ්චිතතාවයන් හේතුවෙන්, අනාගත කාල පරිච්ඡේදය තුළ වත්කම් හා වගකීම්වල ධාරණ වටිනාකමට ප්‍රමාණාත්මක ගැලපීම් කිරීමට සිදු වන ප්‍රතිඵල ලැබිය හැකිය. එම නිසා සැබෑ පළපුරුද්ද හා ප්‍රතිඵලය මෙම විනිශ්චයන් හා ඇස්තමේන්තු වලට වඩා වෙනස්විය හැකිය.

සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ඇතුලත් කිරීමේ ක්‍රියාවලියේදී මුල්‍ය ප්‍රකාශන තුළ වටිනාකම් හඳුනාගැනීමේදී වඩාත් සැලකිය යුතු බලපෑමක් ඇතිකරන පහත සඳහන් විනිශ්චයන්ට තක්සේරු හා උපකල්පන කළමනාකරණය විසින් ගනු ලබයි.

(අ) බදුකරණය

සමාගම අදායම් බදු සහ අනෙකුත් බදු වලට යටත්වේ. ප්‍රවර්ථන බද්ද, විලම්භිත බද්ද සහ අනෙකුත් බදු සඳහා වන මුළු ප්‍රතිපාදනයන් නිශ්චය කිරීමේදී ප්‍රමාණාත්මක විනිශ්චයන් අවශ්‍ය වන අතර, මේ සඳහා මුල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා මුල්‍ය වාර්තාකරණ ප්‍රමිත අනුව අවශ්‍ය ගැලපීම් කිරීමේදී සහ බදු නිශ්චය කිරීම සඳහා බදු වන ලාභය ගණනය

කිරීමේදී විසඳුම් ලැබීමට ඇති බදු නිර්දේශයන්ද අදාළ කරගත යුතුයි මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කරන අවස්ථාවේදී අදාළ වන බදු නීතීන් හි අර්ථකතනයන් පිළිබඳව යම් යම් අවිනිශ්චිතතාවයන් පැවතිණි.

සමාගම වර්තමාන, විලම්භීත සහ වෙනත් බදු සඳහා වත්කම් හා වගකීම් හඳුනාගනුයේ අතිරේක බදු පවතීද යන තක්සේරුව මත වේ. අවසාන බදු ප්‍රතිඵලයේ වගකීම මුලික සටහන් වලින් වෙනස්වීමේදී, එම වෙනස තීරණය කරන ලද කාලපරිච්ඡේදය තුළ ආදායම්, විලම්භීත සහ බදු වටිනාකමට බලපානු ලබයි.

(ආ) දේපළ සහ උපකරණ වල ඵලදායි ජීවිත කාලය

සුන්බුන් අගය, ඵලදායි කාලය හා වත්කම් ක්ෂය කිරීමේ ක්‍රමය සෑම වාර්තාකරණ දිනකටම විමර්ශණය කරයි. කළමනාකරණයේ විනිශ්චයන් මත වටිනාකම් අනුපාත ක්‍රම භාවිතා කරනු ලබන අතර එමනිසා ඔවුන් අවිනිශ්චිතාතාවයන්ට යටත්වේ.

(ඇ) අඛණ්ඩ පැවැත්ම

සමාගම විසින් සමාගමේ පවත්වාගෙන යාමේ හැකියාව නොහොත් අඛණ්ඩ පැවැත්ම තක්සේරු කරනු ලබන අතර ව්‍යාපාරය අනාගත අවිනිශ්චිත කාලයක් අඛණ්ඩව කරගෙන යාමට අවශ්‍ය සම්පත් තිබේද යන්න පිළිබඳවද සලකා බලයි. තවදුරටත් ක්‍රියාකාරී ව්‍යාපාරයක් ලෙසට දිගින් දිගටම පවත්වා ගැනීමට ඇති හැකියාව පිළිබඳව සාධාරණ සැකයක් ජනිත විය හැකි කිසියම් වූ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පිළිබඳව අධ්‍යක්ෂක මණ්ඩලයට දැනීමක් නොමැත. එසේ හෙයින් සමාගමේ ක්‍රියාකාරකම් නවතා දැමීමට හෝ ඈවර කිරීමට අදහසක් නොමැත.

(ඉ) ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

2022 මාර්තු 31 වන විට සමාගමේ ප්‍රතිඵල කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කල හැකි පසු ශේෂ පත්‍ර සිදුවීම් කිසිවක් වාර්තා වී නොමැත.

(ඊ) මූල්‍ය වත්කම් මත හානිකරණ අලාභ

විස්තීර්ණ අදායම් ප්‍රකාශය තුල හානිකරණ අලාභ වාර්තා කිරීම සඳහා යම්කිසි හරයාත්මක සාක්ෂි පවතීද යන්න පිළිබඳ සෑම වාර්තාකරණ දිනයකදීම හෝ නිරන්තරව සමාගම විසින් ඇගයීමක් සිදු කරයි.

(උ) විකිණීම සඳහා පවතින ආයෝජනවල හානිකරණය

සමාගම විසින් සෑම වාර්තාකරණ දිනයකදීම විකිණීම සඳහා පවතින ආයෝජන ලෙස හඳුන්වන කොටස් අරමුදලට ලබා දී ණය හානිකරණය වී ඇතිද යන්න විමර්ශනය කරයි. සියලුම ණය සහ තැන්පතු සඳහා සමාන තක්සේරු ක්‍රියාවලියක් යොදාගත යුතුය.

(ඌ) විලම්භීත බදු වත්කම්

විලම්භීත බදු වත්කම් හඳුනාගනුයේ යම් ප්‍රමාණයකට භාවිතා නොකල බදු අලාභ සහ බදු බැර පවතින බදු අයකළ හැකි ලාභයට එරෙහිව භාවිතා කළ හැකිනම් පමණි. සුදුසු කාලය සහ අනාගත බදු සැලසුම් උපාය මාර්ග සමඟ එක්ව පවතින පදනම මත හඳුනාගත හැකි විලම්භීත බදු වත්කම් සඳහා සැළකිය යුතු කළමණාකරණ විනිශ්චයන් අවශ්‍යවේ.

(එ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වල ප්‍රමිත වටිනාකම ධාරණ අගය තීරණය කරනු ලබන්නේ ආයුගණක උපකල්පන සලකා බලන සූත්‍රයක් භාවිතා කරමින්ය. මෙහි අනාගතයේ සිදුවන සත්‍ය සංවර්ධනයන්ගෙන් වෙනස් විය හැකි විවිධ උපකල්පනයන් ඇතුලත් කිරීම මෙයට ඇතුළත් වේ.

මෙහි ඇතුලත් වනුයේ වට්ටම් අනුපාතවල නිර්ණය කිරීම්, අනාගත වැටුප් වැඩිකිරීම්, සේවක පිරිවැටුම් අනුපාතය යනාදියවේ. අගය කිරීමේ සංකීර්ණතාවය, පාදකවූ උපකල්පන හා එහි දිගු කාලීන ස්වභාවය හේතු කොටගෙන මෙම උපකල්පන වල වෙනස්වීම නිශ්චිත ප්‍රතිලාභ සැලසුමකදී ඉතා සංවේදී වේ. සියළුම උපකල්පන සෑම වාර්තාකරන දිනයකදීම නිරීක්ෂණය කරනු ලබයි. යෝග්‍ය වට්ටම් අනුපාත තීරණය කිරීමේදී නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව බලාපොරොත්තුවන කාලයට යෝග්‍යවන තක්සේරු කරන කල්පිරීම සමග ශ්‍රී ලංකා රාජ්‍ය බැඳුම්කරණ ප්‍රතිලාභ කළමනාකරණය විසින් සලකා බලනු ලබයි. සමාගමේ අපේක්ෂිත අනාගත වැටුප් වැඩිවීමේ අනුපාතය සහ අනාගත අපේක්ෂිත උද්ධමන අනුපාතය මත අනාගත වැටුප් වැඩිවීම තීරණය කරයි.

4. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්වල සාරාංශය

මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සමාගම විසින් යොදාගනු ලබන සැලකියයුතු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පහත සඳහන් වේ. විශේෂයෙන් සඳහන් නොවන්නේ නම්, පහත සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අඛණ්ඩ සියළුම කාලපරිච්ඡේදවල මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී යොදාගනු ලබයි.

4.1 ආදායම් හඳුනාගැනීම

4.1.1 භාණ්ඩ විකුණුම්

පහත සඳහන් සියළුම කොන්දේසි සම්පූර්ණ කරන විට භාණ්ඩ විකුණුම් වලින් ආදායම හඳුනාගනී.

- ගැණුම්කරුවන් කොන්ත්‍රාත්තුව අනුමත කර ඇතිවිට (ලිඛිතව, වාචිකව හෝ වෙනත් චාරිත්‍රානුකූල ව්‍යාපාර පිළිවෙත් වලට අනුකූලව) සහ ඔවුන්ගේ වගකීම් ඉටුකිරීමට කැපවී සිටින අවස්ථාවක,
- භාණ්ඩ සහ සේවා මාරුවන අවස්ථාවේදී සෑම පාර්ශවයකම අයිතීන් හඳුනාගතහැකි අවස්ථාවක,
- භාණ්ඩ සහ සේවා මාරුවන අවස්ථාවේදී සෑම පාර්ශවයකම දෑරෑ පිරිවැය හඳුනාගත හැකි අවස්ථාවක,
- ගිවිසුම වාණිජමය මුහුණුවරක් ගන්නා අවස්ථාවකදී,
- පාරිභෝගිකයා වෙත මාරු කරනු ලබන භාණ්ඩ හා සේවා සඳහා විනිමය වශයෙන් සමාගමට හිමිවන ලබන බැලීම් එකතු කිරීමට ඉඩ ඇතිවිට

4.1.2 පොළි ආදායම

ස්ථාවර තැන්පතු සහ REPO ආයෝජන වලින් ලැබෙන පොළී ආදායම සැබෑ පොළී අනුපාතය භාවිතා කරමින් උපචිත පදනම මත හඳුනාගැනේ. කෙසේවෙතත්, කාර්ය මණ්ඩල ණය වලින් ලැබෙන පොළී ආදායම සිදුවූ විට සහ සැබෑ පදනම මත හඳුනාගැනේ.

4.1.3 ලාභාංශ ආදායම

ලාභාංශ ආදායම හඳුනාගනු ලබන්නේ ලාභාංශ ලද විට, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල සැබෑ පදනම මතය.

4.1.4 වෙනත් ආදායම

වෙනත් ආදායම් ලද විට, සැබෑ පදනම මත හඳුනාගනු ලබයි.

4.2 වියදම් හඳුනාගැනීම

දූරෑ පිරිවැය සහ විශේෂිත අයිතමයක ආදායම් ඉපයීම් අතර සෘජු සම්බන්ධයේ පදනම මත වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනී.

ව්‍යාපාරය කරගෙන යාමෙ/දි ඇතිවන සියලුම වියදම් සහ දේපළ, පිරියත උපකරණ ඵලදායි ආකාරයෙන් පවත්වාගෙන යාම තුල ඇතිවන අයකර ගැනීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හඳුනාගනී. ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අරමුණුනින්, සමාගමේ කාර්‍යසාධනයේ සාධාරණ අගය ඉදිරිපත් කිරීමේ පදනම මත “වියදම් ශ්‍රිත” ක්‍රමය පවත්වාගෙන යයි. ආදායම් බදු වියදම් තුළ ජංගම හා විලම්භීත බදු ඇතුලත්වේ. ආදායම් බදු වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගනී.

4.3 බදු

4.3.1 ජංගම බදු

ජංගම බදු වත්කම් හා වගකීම් තුල ප්‍රවර්ථන වර්ෂය සඳහා දේශීය ආදායම් බදු කොමසාරිස් ජනරාලගෙන් අයවියයුතු හෝ ගෙවියයුතු සහ පෙර වසර සඳහා ගැලපීමක් සිදු කළ යුතු නම් එය ඇතුළත් වේ. වාර්තාකරණ දිනට නිතීගත කර ඇති හෝ ඊට පසුව නිතිගත කර ඇති බදු නීති සහ බදු අනුපාත යොදා ගනිමින් වටිනාකම ගණනය කරනු ලබයි.

4.3.2 විලම්භීත බදු

විලම්භීත බදු පනවනු ලබන්නේ මුල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා බදුවල ධාරණ අගය සහ වත්කම් සහ වගකීම් වල බදු පදනම අතර වාර්තාකරන දිනට පවතින තාවකාලික වෙනස්කම් මත වගකීම් ක්‍රමය යොදාගනිමිනි.

සියළුම අඩුකළ හැකි වෙනස්කම් සඳහා විලම්භීත බදු වත්කම් හඳුනාගනී. භාවිතා නොකරන බදු බැර වල ඉදිරියට ගෙනයාම සහ භාවිතා නොකළ බදු අලාභ යම් ප්‍රමාණයකට අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් පවතින බදු අයකල හැකි ලාභයට එරෙහිව ලබාගත හැකි බව හෝ භාවිතා නොකළ බදු අලාභ හා භාවිතයට නොගත් බදු ගෙවීම් භාවිතා කල හැකි විය යුතුයි.

සෑම වාර්තාකරණ දිනකටම විලම්භීත බදු වත්කමේ ධාරණ අගය විමර්ශනය කරනු ලබන අතර, විලම්භීත බදු වත්කමේ මුළ අගය හෝ කොටසක් ප්‍රමාණවත් බදු අයකළ හැකි ලාභයෙන් තවදුරටත් යම් ප්‍රමාණයක් දක්වා අඩුකරනු ලබයි. හඳුනා නොගත් විලම්භීත බදු වත්කම් සෑම මුල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයකම නැවත අගය කරනු ලබන අතර, අනාගත බදු අයකළ හැකි ලාභය, විලම්භීත බදු වත්කම ආවරණය කර ගැනීමට ඉඩදේ නම්, තවදුරටත් යම් ප්‍රමාණයකට හඳුනාගත හැකිය. විලම්භීත බදු වත්කම් හා වගකීම්, නීතිගත කරන ලද හෝ පසුකාලිනව නීතිගත කරන ලද, බදු නීතිරීති සහ බදු අනුපාතවලට අනුව වත්කම් හඳුනාගැනීම හෝ වගකීම් නිරාකරණය කරගත් විට, වර්ෂය තුළ යොදාගැනීමට අපේක්ෂා කරන බදු අනුපාතයට අගය කරනු ලබයි.

4.4 මූල්‍ය නොවන වත්කම්

4.4.1 දේපළ, පිරියත සහ උපකරණ

හඳුනාගැනීම සහ මැනීම

වත්කම් ආශ්‍රිතව ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරයට ගලා ඒමේ ප්‍රවණතාවක් පවතී නම් සහ වත්කමේ පිරිවැය LKAS 16 දේපළ, පිරියත හා උපකරණ ප්‍රමිතයට අනුව විශ්වාසදායීව මැනිය හැකිවිට දේපළ පිරියත සහ උපකරණ හඳුනාගනු ලබයි. මූලිකවම දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට මිණුම් කරයි.

පිරිවැය ආකෘතිය

දේපළ පිරියත සහ උපකරණ දෛනික සේවා පිරිවැයෙන් සහ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරන වටිනාකම අඩුකර පිරිවැයට හෝ ප්‍රත්‍යාගණන අගයට ප්‍රකාශ කරනු ලබයි. හඳුනාගන්නා ලද උපමානයන් හමුවුනහොත් ප්‍රතිස්ථාන පිරිවැය එම පිරිවැය දුරුවිට එම පිරිවැය තුළ ඇතුලත් කරයි.

පසුකාලින පිරිවැය

පසුකාලින පිරිවැය ලෙස හඳුන්වනුයේ ව්‍යාපාරය පවත්වාගෙන යාමේ හෝ වත්කම් ඉපැයීමේ හැකියාව වර්ධනය කිරීමේ අදහසින් පසුකාලීනව දරන ලද ස්ථාවර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම්, දිර්ඝ කිරීම හෝ වැඩිදියුණු කිරීම් වන අතර, මේවා ප්‍රාග්ධන වියදම් ලෙස සැළකේ. එවැනි වියදම් වත්කමේ ධාරණ අගය තුළ හඳුනාගනී. දේපළ, පිරියත උපකරණ වල දෛනිකව ඇතිවන සේවාවල පිරිවැය, විස්තිර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනියි.

ක්ෂයවීම්

සරල මාර්ග ක්‍රමය භාවිතා කොට දේපළ සහ උපකරණ වල පිරිවැය සුන්බුන් අගය දක්වා ඵලදායි ජීවිතකාලය පුරා ලියා හරිමින් ක්ෂයවීම් ගණනය කරයි. මිලදී ගැනීමේ දිනයේ සිට අත්තිකාරම් පදනම මත ඉවත් කිරීම දක්වා ක්ෂය වීම සිදු කරයි. ඉඩම් ක්ෂය නොකරයි.

තක්සේරු කරන ලද ඵලදායී ජීවිත කාලය මත ක්ෂය අනුපාත පහත දැක්වේ.

වත්කම් වර්ගය	ක්ෂය ප්‍රතිශතය (%)
ගොඩනැගිලි	4
යන්ත්‍ර, පිරියත හා විදුලි උපකරණ	10
මෝටර් වාහන	20
කාර්යාල උපකරණ	20
ලීබඩු හා සවිකිරීම්	20
පරිගණක දෘඩාංග හා මෘදුකාංග	20
ඉඩම් සහ ඉඩම් වැඩි දියුණු කිරීම	05

සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම දේපළ, පිරියත හා උපකරණවල සුන්බුන් අගය, ඵලදායී ජීවිතාකාලය හා ක්ෂය කිරීමේ ක්‍රමය සළකා බලන අතර ඒ සඳහා සංශෝධනයක් අවශ්‍ය නම් සිදුකරනු ලබයි. තාක්ෂණික වෙනස්වීමක් මත හෝ වෙනයම් හේතුවක් මත කිසියම් වත්කමක වටිනාකම සැළකිය යුතු ලෙස වෙනස් වුයේ නම් අදාළ අයිතමයේ ස්වභාවය හා වටිනාකම මත ක්ෂය කිරීම ගැලපෙන අනුපාතයට සිදුකිරීම හෝ සමාගමේ ලාභයට එරෙහිව කපාහැරීම සිදුකළ යුතුයි. (උදා : ජංගම දුරකථන, කැමරා)

වත්කමක වටිනාකම රු. 5,000 ක් ඉක්මවන්නේ නම් එය මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කමක් ලෙස සළකයි. රු.5,000 කට අඩු වත්කම් ප්‍රමාණාත්මක නොවන ලෙස සළකන අතර, ලාභයට එරෙහිව කපාහරිනු ලැබේ. අනාගතයේදී සත්‍යාපනය සඳහා අදාළ දෙපාර්තමේන්තු මගින් ලේඛනයක් පවත්වාගෙන යයි.

ප්‍රති හදුනා ගැනීම

දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් හෝ භාවිතා කිරීම තුළින් අනාගත ආර්ථික ප්‍රතිලාභ නොමැති නම් ඒවා හදුනා නොගනී. වත්කම් ප්‍රති හදුනා ගැනීම මත ඇති වන ලාභය හෝ අලාභය (ශුද්ධ විකුණුම් වටිනාකම සහ වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කරයි) වත්කම් ප්‍රති හදුනා ගැනීම වර්ෂය තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ "වෙනත් මෙහෙයුම් ආදායම්" යටතේ හදුනාගනු ලබයි.

4.4.2 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සමාගම විසින් සෑම ගිණුම් කාලච්ඡේදයක් අවසානයේදීම එහි වත්කම්හි හානිකරණය සිදුකිරීම සඳහා ඇඟවීමක් ඇත්ද යන්න පිළිබඳ විවරණයක් සිදු කරයි. කිසියම් ඇඟවීමක් පවතින්නේ නම්, හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂාවක් අවශ්‍යවන විට, සමාගම විසින් වත්කමේ නැවත අයකරගත හැකි අගය ඇස්තමේන්තු කරයි.

4.5 මෙහෙයුම් බදු

කල්බදු හිමියා විසින් කල්බදු කාලය පුරා අයිතියේ ප්‍රතිලාභ සහ සියළුම පසුකාලීන අවදානම් ඵලදායිව රඳවා ගනී නම් එවැනි බදු මෙහෙයුම් කල්බදු ලෙස වර්ගීකරණය කරයි. මෙහෙයුම් කල්බදු ගෙවීම කල්බදු කාලය පුරා සරල මාර්ග ක්‍රමයට වියදමක් ලෙස හදුනාගැනීම හෝ කල්බදු වත්කම් භාවිතා කිරීමෙන් ලැබෙන ආර්ථික ප්‍රතිලාභ ගලාඑන කාල පිළිවෙලේ නිරූපණය මත හඳුනාගනු ලබයි.

4.6 තොග

සාමාන්‍ය තොග අගය පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන අගයන් වලින් අඩු අගයට ප්‍රකාශ කරයි. නිෂ්පාදන පිරිවැය මත පදනම්ව බරිත සාමාන්‍ය පදනම මත පිරිවැය හඳුනාගනී. පොස්පේට් තොග අගය කරන විට කැණීම් පිරිවැයෙන් 40% ක් කැබලි කරන ලද (සකස් නොකළ) නිෂ්පාදනයටද ඉතිරි 60% ක් නිමි (සකස් කළ) නිෂ්පාදනයටද විභජනය කිරීම භාවිතයේ පවතී. ශුද්ධ උපලබ්ධි අගය වනුයේ, සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී විකිණීමට තබා ඇති තොගවල මිල ගණන උපලබ්ධි කිරීම සඳහා පිරිවැය අඩු කිරීමෙන් පසුවය. සෑම ගිණුම් කාලච්ඡේදයක් අවසානයේදීම යල්පැනගිය, මන්ද සංචලන සහ දෝෂ සහිත තොග සඳහා අවශ්‍ය වෙන්කිරීම් සිදුකරනු ලබයි.

4.7 මූල්‍ය වත්කම් හඳුනාගැනීම සහ මැනීම

ප්‍රවර්ථන වර්ෂය තුළදී ක්ෂය කල පිරිවැය මත හඳුනාගත් මූල්‍ය වත්කම් වෙනත් විස්තීර්ණ අදායම් ප්‍රකාශය තුළ හඳුනාගත් සාධාරණ අගය හෝ ලාභ අලාභ ප්‍රකාශය තුළ හඳුනාගත් සාධාරණ අගය පහත පදනම් දේ මත වර්ග කරනු ලබයි.

අ) මූල්‍ය වත්කම් කළමනාකරණය සඳහා සමාගමේ ව්‍යාපාරික ආකෘතිය

ආ) මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ

පහත කොන්දේසි දෙකම සපිරේ නම් මූල්‍ය වත්කම් ක්ෂය කළ පිරිවැයට හඳුනාගත හැකිය,

අ. ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කර ගැනීම සඳහා ව්‍යාපාර පරිචය තුළ පවත්නා මූල්‍ය වත්කම්,

ආ. මූලික ගෙවීමක් හෝ හිඟ ප්‍රධාන මුදල මත ගෙවනු ලබන පොළිය මගින් නිශ්චිත දිනකදී මුදල් ප්‍රවාහය ඉහළ නංවන මූල්‍ය වත්කම්,

පහත කොන්දේසි දෙකම සැපිරේ නම්, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළින් හඳුනාගන්නා සාධාරණ අගයට මූල්‍ය වත්කම් මනිනු ලබයි.

(අ) ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කර ගැනීම සඳහා ව්‍යාපාර පරිචය තුළ පවත්නා මූල්‍ය වත්කම්,

(ආ) මූලික ගෙවීමක් හෝ හිඟ ප්‍රධාන මුදල මත ගෙවනු පොළිය මගින් නිශ්චිත දිනකදී මුදල් ප්‍රවාහය ඉහළ නංවන මූල්‍ය වත්කම්,

4.8 මුදල් හා බැංකු ශේෂ

මුදල් හා බැංකු ශේෂ හඳුනාගනු ලබන්නේ අතැති මුදල් සහ බැංකු ශේෂ වශයෙන්ය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා මුදල් සහ මුදල් සමාන දෑ හඳුනාගනු ලබන්නේ, අතැති මුදල් සහ බැංකු තැන්පතු මගින් බැංකු අයිරාවේ අගය අඩු කල පසුව වේ. කොවිඩ් 19 වසංගතය හේතුකොටගෙන මෙහෙයුම් බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා සමාගම විසින් ස්ථීර බැංකු අයිරා පහසුකම් ලංකා බැංකුව, ග්‍රෑන්ඩ්පාස් ශාඛාව තුළින්ද (මිලියන 35) මහජන බැංකුව, එප්පාවල ශාඛාව (මිලියන 8) තුළින්ද ලබාගෙන ඇත. කෙසේවෙතත්, වර්ෂය අවසාන දිනට බැංකු අයිරා පහසුකම් ශූන්‍ය අගයක් ගනු ලබයි.

4.9 ප්‍රකාශිත ප්‍රාග්ධනය

සාමාන්‍ය කොටස්, හිමිකම් ලෙස වර්ගකරයි. හිමිකම් සාධන පත්‍ර වටිනාකම මනිනු ලබන්නේ මුදලේ හෝ වෙනත් වත්කම් ලැබීම හෝ ලැබිය යුතු දෑ හි සාධාරණ අගයට , හිමිකම් සාධන පත්‍ර නිකුත් කිරීමේ සෘජු ශුද්ධ පිරිවැය අඩු කල පසු වේ.

4.10 විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාව

4.10.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම - පාරිතෝෂික

සමාගම 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත අනුව පාරිතෝෂික ගෙවීමට බැඳී සිටී. පාරිතෝෂිකය ගෙවීමට ඇති වගකීම් අනුව අබණ්ඩව අවුරුදු 05 ක සේවා කාලයක් සම්පූර්ණ විය යුතුය. එම පනත යටතේ සමාගමේ වගකීම නිවැරදි උපකල්පන මත ගොඩනැගූ සූත්‍රය (ප්‍රක්ෂිප්ත) මත පදනම් වේ. උපකල්පන හා ක්‍රමවේදය මත ගණනය කල සේවකයින්ගේ 2022 මාර්තු 31 දිනට විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාව මත වූ වර්තමාන අගය රු.31,310,870.00 කි. එමෙන්ම විශ්‍රාම ප්‍රතිලාභ මත වූ වර්තමාන අගය 2021 මාර්තු 31 දිනට රු. 56,318,245.00 ක් විය. එම වගකීම බාහිර අරමුදලක් ලෙස ලංකා බැංකුවේ ග්‍රෑන්ඩ්පාස් ශාඛාවේ ස්ථාවර තැන්පතුවක් ලෙස පවතී. වර්ෂ අවසාන වන විට එම ස්ථාවර තැන්පතුවේ වටිනාකම රුපියල් 70,367,735.96 කි. එක් එක් වර්ෂය අවසානයේ දී තීරණය කරන ලද වගකීම් මත වාර්ෂිකව ආයෝජනය කරනු ලබන මුදල වාර්ෂිකව සමාලෝචනය කෙරේ.

4.10.2 නිශ්චිත දායක සැලසුම

නිශ්චිත දායක සැලසුමක් යනු වෙනමම ඒකකයක් තුල ස්ථීර දායකයක් ගෙවන සහ අමතර වටිනාකම් ගෙවීමට නීතිමය හෝ නිර්මාණාත්මක බැඳියාවක් නොමැති පසු සේවක ප්‍රතිලාභ සැලසුමකි. නිශ්චිත දායක සැලසුම්

දායකත්වය සඳහා බැඳියාව හඳුනාගනු ලබන්නේ සේවකයා සේවය කරන කාලයතුල, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සේවක ප්‍රතිලාභ වියදම් වශයෙන්ය.

(අ) සේවක අර්ථසාධක අරමුදල

අනුමත අර්ථසාධක අරමුදලට සෑම සේවකයෙකුගේම වැටුප මත සමාගමේ හා සේවකයාගේ දායකත්වය 12% සහ 10% වශයෙන් වේ.

(ආ) සේවක භාරකාර අරමුදල

සමාගම විසින් සෑම සේවකයෙකුගේම වැටුප් මත 3% ක දායකත්වයක් සේවක භාරකාර අරමුදලට යොදයි.

4.11 මූල්‍ය වගකීම්

පහත සඳහන් අ සහ ආ හැර සමාගම සියලු මූල්‍ය වගකීම් පසු කාලීනව මනිනු ලැබූ ක්ෂය පිරිවැයට වර්ගීකරණය කරයි.:

(අ) ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමකින් යුත් මූල්‍ය වගකීම්

(ආ) මූල්‍ය වත්කම් මාරුවක් හඳුනා ගැනීම සඳහා සුදුසුකම් නොලබන විට හෝ අඛණ්ඩව සම්බන්ධවීමේ ප්‍රවේශය අදාළ වන විට පැන නගින මූල්‍ය වගකීම්.

4.12 වෙන් කිරීම

වෙන්කිරීම් හඳුනාගනුයේ සමාගමේ අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැඳියාවක් (නීතිමය හෝ නිර්මාණාත්මක) පවතින විට සහ බැඳියාව නිරාකරණය කිරීමේදී ආර්ථික ප්‍රතිලාභ ජනිත කරන සම්පත් පිටතට ගලායාමේ හැකියාවක් පවතින හා බැඳීම විශ්වාසදායකව මැනිය හැකි විටදීය. ඕනෑම වෙන් කිරීමකට අදාල වියදම් ප්‍රතිපූර්ණයන් අඩු කළ පසු විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ ඉදිරිපත් කරයි.

4.13 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

LKAS 07 - මුදල් ප්‍රවාහ ප්‍රකාශය, යන ප්‍රමිතයේ නියමයන් අනුකූලව වක්‍ර ක්‍රමය යොදාගනිමින් සකස් කර ඇත. මුදල් හා මුදල් සමාන දෑ වල අතැති මුදල්, බැංකු මුදල් සහ බැංකු අයිරා අඩංගු වේ.

4.14 ආංශික තොරතුරු

ඛණ්ඩයක් යනු සේවා සැපයීම තුළ නියැලෙන හඳුනාගත හැකි අංගයන් වන අතර වෙනත් අංගයන්ගේ වෙනස්වූ අවධානම් සහ ප්‍රතිලාභවලට හිමිකම් ලබයි. වෙන් වශයෙන් හඳුනාගතහැකි අංගයන් අඛණ්ඩයන් සමාගම සතුව නොමැති බැවින් සියළුම මෙහෙයුම් එක් ඛණ්ඩයක් ලෙස සලකනු ලබයි.

රැස්වීම් පිළිබඳ දැනුම්දීම

සී/ස ලංකා පොස්පේට් සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම 2022 දෙසැම්බර් මස 19 වන දින පස්වරු 4.00 ට කොළඹ 14, නව කැළණිපාලම පාර, අංක 73 1/1 දරණ ස්ථානයේ පිහිටි ප්‍රධාන කාර්යාලයේදී පහත කාරණා සඳහා පවත්වන බව කොටස්කරුවන්ට මෙයින් දැනුම් දෙමි.

1. 2021 දෙසැම්බර් මස 22 පැවති වාර්ෂික මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තා අනුමත කිරීම.

2. 2022.03.31 න් අවසන් වූ වසර සඳහා ගිණුම් විගණන ගිණුම් ප්‍රකාශය හා 2022.03.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය හා විගණකාධිවරුන්ගේ වාර්තාව මෙහි සඳහන් කර ඇත.

3. මේ සමඟ එවනු ලබන වාර්ෂික වාර්තාව ලැබීමට සහ අනුමත කිරීම.

4. මහා භාණ්ඩාගාරයට සමාගමේ එකම කොටස්කරු ලෙස 2021/2022 වර්ෂය සඳහා ලාභාංශ බෙදා හැරීම අනුමත කිරීම.

5. සමාගමේ සංගමයේ ලිපිවල 92 සහ 93 වන වගන්ති ප්‍රකාරව විශ්‍රාම යන (වාර්ෂික මහා සභා රැස්වීමේදී) විශ්‍රාම යන අධ්‍යක්ෂකවරුන් සහ සමාගමේ සංගමයේ 94 වන වගන්තිය යටතේ නැවත තේරී පත්වීම.

6. 2022/2023 වර්ෂය සඳහා විගණකවරු පත්කිරීමට සහ වර්ෂය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පාරිතෝෂිකය තීරණය කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් හට බලය පැවරීම.

7. දැනුම්දී ඇත අනෙකුත් දේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය මත,
කල්රුප්කෝ මැනේජ්මන්ට් සර්විස් (පුද්ගලික) සමාගම
සී/ස ලංකා පොස්පේට් සමාගමේ ලේකම්වරුන්

සටහන්

මහා සභා රැස්වීමේදී කොටස්කරුවෙකුට ඔහු වෙනුවෙන් ඡන්දය දීමට, ඔහු/ඇය වෙනුවෙන් ඡන්දය පාවිච්චි කිරීමට සහ පැමිණීමට ප්‍රතියුක්තකයෙකු පත් කිරීමට හිමිකම් තිබේ.ප්‍රතියුක්තකයා සමාගමේ සාමාජිකයෙකු වීම අවශ්‍ය නැත. මෙම අරමුණ සඳහා ආකෘති පත්‍රය අමුණා ඇත.

පෙරකලාසියේ ආකෘතිය

සී/ස ලංකා පොස්පේට් සමාගම

බ ල ප ත්‍ර ය

.....පදිංචි.....වන, මම/අපි ඉහත සඳහන් සමාගමේ සාමාජිකයෙකු වීම හේතුවෙන් ..... පදිංචි ..... හෝ ඔහු/ඇය අසමත් වුවහොත් ..... පදිංචි ..... යන අය මගේ/අපගේ බලය ලත් නියෝජිතයා වශයෙන් 2022 දෙසැම්බර් මස 19 වන දින සමාගමේ පැවැත්වෙන වාර්ෂික මහා සභා රැස්වීමේදී සහ යම් කල් තැබීමකදීද එයට ප්‍රතිඵලයක් වශයෙන් පැවැත්වෙන සෑම ඡන්ද රැස්වීමකදීම, අප/මා වෙනුවෙන් ඡන්දය දීමට මෙයින් පත් කරමි/කරමු.

2022 ..... මස ..... දිනයේදී අත්සන් කරන ලදී.

අත්සන .....

<u>සටහන</u>

- නියෝජිතයාට ඔහුට සුදුසු යයි සිතෙන පරිදි රැස්වීමකදී ඉදිරියට ගෙනෙන ලද ඕනෑම යෝජනාවකට ඡන්දය ප්‍රකාශ කිරීමට හැකිය.
- නියෝජිතයා සමාගමේ සාමාජිකයෙකුවීම අවශ්‍ය නැත.
- සම්පූර්ණ කිරීමට අවශ්‍ය උපදෙස් මෙහි පිටුපස සටහන් කොට ඇත.